<u>'පට්ඨාන' දහසයවැනි වැනි දේශනාව</u>

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සීල සම්පත්තියෙන්ද සමාධි සම්පත්තියෙන්ද ප්‍රඥා සම්පත්තියෙන්ද විමුක්ති සම්පත්තියෙන් විමුක්ති ඥාන දර්ශනයෙන් සමන්නාගත වූ දසබල ඥාන ධර්මයන්ගෙන් සන්තානය පෝෂණය වුනාවූ අතීතය අනාගතය වර්තමාන කියන කාලත්‍රයට සම්බන්ධ සියලුම ස්කන්ධ ආයතන ධාතු ඉන්ද්‍රිය පටිච්චසමුප්පාද ධර්ම හේතුඵල ධර්මයන් චතුරාර්ය සත්‍ය ධර්මයන් සර්වප්‍රකාරයෙන්ම පැහැදිලිව විසිතුරුව ප්‍රභාශ්වරව අලෝකමත්ව අවබෝධ කොට ගත්තාවූ දේශනා කරන්නාවූ දේශනා ඥානයෙන් සමන්නාගත වූ සත්වයන් කෙරෙහි පතල මහා කරුණාවක් දයාවක් මෛත්‍රියෙන් තෙත් වූ සන්තානයක් ඇති සම්මා සම්බුදු රජාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්තිනායක ධර්ම රාජයාණන් වහන්සේ අවබෝධකොට ගත්තාවූ ලෝකයට දේශනා කොට වදාළා වූ ශ්‍රී සත්ධර්මස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන්වහන්සේගේ ධර්මයට කන් යොදා හිත යොදා ධර්ම මාර්ගයේ සුපටිපන්න ආදී ගුණධාරීව වැඩම කළාවූ ඒ ආර්ය ධර්මයට ලං වුනාවූ ආර්ය ධර්මයන් අවබෝධකොටගෙන සංසාර දුකින් මිදී ගියාවූ මිදී යන්නාවූ ප්‍රතිපත්තියෙහි යෙදෙන්නාවූ අශ්ටාර්යපුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ ඇති අනන්ත වූ අපරිමාණ ගුණ ආනුභාව බලයෙන්ද ඒ අනන්ත ගුණ ඇති ත්‍රිවිධ රත්නය සිහිපත් කොට වන්දනා කිරීමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන්ද අපේ මේ පිංවත් අසාගෙන සිටින්නාවූ සියලු දෙනාම ජීවිතය පුරා දාන වශයෙන් පහළ කර ගත්තාවූ සීල වශයෙන් භාවනා වශයෙන් පහළ කරගත්තාවූ කාමාවචර කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් උපචාර සමාධි අවස්ථාවල පහළ වූ ප්‍රභාශ්වර වූ නීවරණයන් නැත්තාවූ ඒ කාමාවචර කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් යම්කිසි වෙලාවක රූපාවචර සිත් පහළ වූවානම් ඒ ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් ආමිස වශයෙන් ප්‍රතිපත්ති වශයෙන් වඩා ගත්ත සියලුම ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අද මේ සාකච්ඡාව තුලින් දේශනාව තුලින් අපි කියල දෙන්නාවූ ධර්ම කරුණුත් මේ පින්වතුන්ට හොඳින් වැටහේවා! තේරුම් ගන්ට ලැබේවා! ඒ සඳහා සිහිය නුවණ යෝනිසෝමනසිකාරය සති සම්පජඤ්ඤය වැඩේවා! නීවරණයන්ගෙන් හිත්වලට බාධාවක් නොම වේවා! මේ ගාම්භීර වූ පට්ඨාන ධර්මය ධර්ම කරුණු තේරුම් අරගෙන වටහාගෙන ධම්මානුපස්සනාවක් හැටියට එයට හිතයොදා මනසිකාරය පවත්වා අඩුපාඩු ධර්ම ශක්තිය තර කරගෙන දියුණු කරගෙන

හැමදෙනාටම උතුම් නිවන් ගමන යාගන්ට ලැබේවා! නිවන් අවබෝධ කරගන්ට ලැබේවා! ඒ සඳහා මෙය මහා ප්‍රත්‍යයක් වේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා!

බුදුරජාණන්වහන්සේගේ සන්තානයට ඥානයට උන්වහන්සේට දැනී ගිය පෙනී ගිය ඒ ධර්ම හරී විසාලයි. ලෝකයේ තියෙන සෑම ධර්මයක්ම උන්වහන්සේට පැහැදිලිව ඉතාමත්ම හොඳින් පෙනී ගියා. නමුත් දේසනා කරපු ධර්ම කොට්ඨාසය - කාණ්ඩය හරි ටිකයි. ඒ දේසනා කරන ලද ධර්ම කාණ්ඩය - ටිකක් දේසනා කරන්ට හේතුව, බුදුරජාණන්වහන්සේ නමක් සර්වාකාර පරිපූර්ණ ධර්මය අවබෝධ කරගන්නෙ සාරා අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් - ඊට වඩා වැඩි කාලයක් පාරමී ගුණ ධර්ම දියුණු කරලා. ධර්මය අසන්නාවූ ශ්‍රාවකයෝ එච්චර කාලයක් නිවන් අවබෝධ කරගන්නට හරි බණ අහන්ට හරි පාරමී ගුණ ධර්ම පුරන්නේ නෑ. බෝධි සත්වයන් වහන්සේ නමක් හැටියට දීර්ඝ කාලයක් ගුණ ශක්තිය - ධර්ම ශක්තිය වඩල අවබෝධ කරගත්ත පරිපූර්ණ ධර්මයක් - පොඩි ශක්තියක් - පාරමී ශක්තියක් ඇත්තාවූ කෙනෙකුට - හිතකට - ඥානයකට අවබෝධ කරගැනීම දුෂ්කරයි. ඒ බවත් ඒ ස්වභාවයත් බුදුරජාණන්වහන්සේ අවබෝධ කරගත්තා. ඒ නිසා අසන්නාගේ සිතට ගැලපෙන - අහුවෙන ඒවාගේම අවබෝධ කරගන්ට ප්‍රමාණවත් වෙච්ච ධර්ම කාණ්ඩයක් න්‍යාය ගතකරලා යම්කිසි ක්‍රමයකට ඒ හිත් වලට අහුකරගන්ට මුසුකරගන්ට අල්ලගන්ට පුළුවන් සුදුසු ක්‍රමයකට බුදුරජාණන්වහන්සේ උදාහරණ උපමාවල් ඇතුව මාතිකා ගත කරලා දේශනා කළා. ඒ කොටසක් තමයි අද අපි මේ නැවත වතාවක් මේ සපර්ශ කරන්නේ මේ සාකච්ඡා කරන්ට යන්නේ.

පසුගිය සතියේ භාවනා වැඩ සටහනක් පැවැත්වුනා. ඊට කලින් ගිය බ්‍රහස්පතින්දා ධර්ම කොටසක් සාකච්ඡා කළා. එතනදී යම් ධර්ම කොටසක් සාකච්ඡා කළා 'නිස්සය ප්‍රත්‍යය' යටතේ. තව ඒ පිළිබඳව පොඩි හැඳින්වීමක් කරන්ට තියෙනවා. ඒකේ පොඩි ගාම්භීර බවක් තියෙනවා. ඒකත් මේ වෙලාවේ කියල දුන්නොත් හොඳයි කියල හිතෙනවා. ඒ වගේම මම ඊට කලියෙන් කරුණක් දැන ගන්ට ඕන පින්වතුන්ගෙන්. ඒ පසුගිය සතියේ කියල දීපු - ඉදිරිපත් කරපු ඒ ධර්ම කොට්ඨාසය තුලින් ඒක අහගෙන යනකොට මේ පින්වතුන්ගේ හිත්වලට යම්කිසි නොගැලපෙන ස්වභාවයක් - ගැටළු සහගත ස්වභාවයක් - ඒ කාරණය තේරුම් ගැනීමට අමාරු අපහසු විදියක් තිබුන නම් ඒක පැහැදිලිව නිරාකරණය කරගත යුතුයි. එතකොට ඒ තුල තිබෙන්නාවූ ප්‍රශ්නත් අපි මේ වෙලාවේ අහන්න ඕන.

මේ ලඟකදී ප්‍රශ්න සාකච්ඡා විශේෂ වැඩ සටහනක් කෙරුනෙත් නෑ. ඊට පස්සේ තමයි අනිත් ඒවාට යන්න ඕන. ඉතින් හැම එක්කෙනාගේම හිත්වලට මේවා දේශනා කරනකොට - සමහර අවස්ථාවලදී කරුණු ග්‍රහණය කිරීම ලේසියි සමහර වෙලාවට අමාරුයි. ඒ ගැන මම ගොඩක් සැලකිලිමත් වෙනවා. ඒවගේම තමයි බුදුරජාණන්වහන්සේගේ මේ පට්ඨාන දේශනාව එහෙම නැත්නම් මාතෘකා වශයන් විස්තර කරලා තියෙන - දේශනා කරලා තියෙන දේවල් දිහා බැලුවයින් පස්සේ මේ කාණ්ඩය සීමා කරන්ට හේතුවක් -

මම දවසක් දකිනවා මේ අම්ම කෙනෙක් පොඩි දරුවෙකුට කවනවා. ඉස්සරනම් සාමාන්‍යයෙන් හැඳි පාවිච්චි කරන්නේ නෑ. ඉස්සර ළමයෙකුට කවන කොට, අත ලොකු අම්ම බත් ගුලියක් අනල පරමාර්ථය කොහොම හරි මේ බත්ටික - මේ කෑම ටික අර ළමයට

කවන්න. නමුත් ඒ අම්ම කරන්නේ බත් ගුලියක් හදල ඒක හැඩ කරනවා. හැඩ කරලා ඒකට නමක් දානවා. ඒ බත්ගුලියට නමක් දානවා. බත්ගුලියට නමක් දාල එක්කෝ කුරුල්ලෙක් කියනවා - එහෙම නැත්නම් මයිනෙක් කියනවා - මොකක් හරි සතෙකුගේ නමක් දාල හරි එහෙම නැත්නම් වෙනත් උපක්‍රමයක් හරි ඒකට ඈඳල ඒවිදියට තමයි ඔය කෑම ටික අර වැඩී යන දරුවට කවන්නේ. සමහර වෙලාවට 'ගුලියට' හදනවා සමහර වෙලාවට 'දිගට' හදනවා. ඒකත් ඒ ළමයාට කැවීමේ උපක්‍රමයක්.

ඊළඟට අදකාලේ මම දකිනවා දවසක් ගෙදරක ඉන්න කොට මේ අම්ම කෙනෙක් ළමයට කවනවා. ඒ ළමය එක තැනක ඉන්නේ නෑ. දුවනවා - ඇවිල්ල කාල යනවා - ආයෙත් සෙල්ලන් කරනවා. ඉතින් මේ අම්ම අතිනුත් කවනවා. ඊළඟට උපක්‍රමශීලීව එයාට කථාවක මොකක්හරි කැල්ලක් කියල දෙනවා. සමහර වෙලාවට උපක්‍රම ශීලිව පොඩි පොරොන්දුවකුත් වෙනවා. ඊළඟට හැන්දක් තියෙනවා. හැන්දකුත් පාවිච්චි කරනවා. ඊළඟට තව එකක් තමයි දියලරලා වගෙත් දුන්න. මේ ඔක්කොම උපක්‍රම ටික - හැන්දක් පාවිච්චි කිරීම -ගුලි කිරීම - ඒවගේම එයාට කථා කියාදීම - ඊළඟට ඔය දියර වශයෙන් හැදීම ආදී හැම එකක්ම - එක දේකටයි aim කරන්නේ. ඒක තමයි මේ ළමයට කැවීම.

බුදුරජාණන්වහන්සේ දේශනා කරන කොට ඔයවගේ උපක්‍රම ගොඩාක් භාවිතා කරලා තියෙනවා, නොදියුණු පෘත්කජන හිතට - කෙලෙස් බරිත පෘතක්ජන හිතට - මේ ධර්‍ම ඇතුල් කිරීම සඳහා. ඒක නිසා එක එක උපමා එක එක කථාවල් ඉදිරිපත් කරලා දේශනා කළා කොච්චර කරුණාවක් බුදුරජාණන්වහන්සේගේ තියෙනවද? ඒ නිසා මේ පට්ඨානය වැනි ගාම්භීර ධර්‍ම කොටසක් - නොයෙක් හේතු ඉදිරිපත්වෙලා හේතු කාරණා අරගෙන දේශනා කරන කාණ්ඩයක් අපිට දෙකනින් අසන්ට ලැබිච්ච එක ගැන අපි ගොඩාක් සන්තෝස වෙන්න ඕනෑ. ඒවාගේම තමයි ඒ ධර්‍ම මෙනෙහි කරන්ට අපිට අපේ හිත මනසිකාර වශයෙන් යොදන්ට ලැබිච්ච එක ගැන සන්තෝස වෙන්න ඕන.

ඉතින් අද මම මේ පින්වතුන්ට පොඩි අවස්ථාවක් සලසා දෙනවා පසුගිය සතියට ආපසු යන්ට. ඊළඟට අර අපේ මහත්තයෙක් ප්‍රශ්නයක් ලියල යොදල තිබුන. ඒ ප්‍රශ්නෙටත් අපි උත්තරයක් හොයා ගන්ට බලමු. ඒ නිසා මම අද දවසේ කියල දෙන්ට යන කාරණා ටිකට බහින්න කලින් මේ පින්වතුන්ට අවස්ථාවක් ලබා දෙනවා පොඩි කාලයක් මේ පින්වතුන්ගේ ප්‍රශ්න තියෙන ටික ඉදිරිපත් කරන්ට. ඉදිරිපත් කරාට පස්සේ අපි ඉස්සරහට යනවා ඒකට උත්තරේකුත් හොයාගෙන. එහෙම කරන්ට හේතුව මේ පින්වතුන්ගේ අවබෝධයත් කොහොමද මේකට බැහැගෙන තියෙන්නේ කියල මට ටිකක් දැන ගන්ට ඕනෑකමක් තියෙනවා. ඒ නිසා මෛත්‍රියෙන් මේ වෙලාවේ මේ පින්වතුන්ට ප්‍රශ්න තියෙන ඒවා ඉදිරිපත් කරන්ට අවස්ථාව සලසා දෙනවා, සැමදෙනාටම තෙරුවන් සරණයි! ධර්‍ම අවබෝධය මේ සෑම දේකින්ම සිද්ධ වේවා කියල ප්‍රාර්ථනා කරමින්.

දළුවත්ත මහතා - තෙරුවන් සරණයි! ගෞරවණීය සවාමීන්වහන්ස, අපි ඊයේ සාකච්ඡාවක් පැවැත්වූවා නිශ්‍රය ප්‍රත්‍යය ගැන අපි ඉගෙන ගත්ත දේවල් සම්බන්ධයෙන් ඉතාම කෙටියෙන්. ඉතින් එහිදී මතු උනා යම් යම් ප්‍රශ්න. අද දවසේ ඒවා ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දුන්න එක ගැන අනේක වාරයක් පිං ස්වාමීන්වහන්ස. මට මතකයි මම සාකච්ඡාවේදී ජයන්ත

මහත්තයාට මතක් කළා මතුවෙච්ච එක ප්‍රශ්නයක් පුළුවන් නම් මතක තියාගෙන ඒක ඉදිරිපත් කරන්න කියල. ඒවගේම මම වසන්ත මහතාගෙන් ඉල්ලා සිටිනවා ඔබතුමත් ඊයේ කිසියම් ආකාරයක ප්‍රශ්නයක් යොමු කළා. අපි ඒ පිළිබඳව කථා කළා නමුත් එතන පැහැදිලි කමක් හරියටම අවේ නෑ. චක්ඛු ද්වාර වීථියක් සම්බන්ධයෙන් කථා කරපු අවස්ථාවේදී වෙච්ච පැහැදිලි කිරීමක්. ඒක නිසා දැනට ඒ ප්‍රශ්න දෙක ඉදිරපත් කරන්න කියල මම ජයන්ත මහත්මයා ගෙනුත් වසන්ත මහත්මයා ගෙනුත්  ඉල්ලා සිටිනවා.

<u>ප්‍රශ්නය </u>- අවසරයි සවාමීන් වහන්ස තෙරුවන් සරණයි හැමදෙනාටම, ඇත්තටම සවාමීන් වහන්ස අපි ගිය සතියේ කරපු සකච්ඡාව විතරක්මත්ද දන්නේ නැහැ ඊයේ කථාකළේ මොකද ඔබ වහන්සේ කලින් අපිට කළ දේශනා අපි පහුගිය ටිකේ ඇහුවා. ඉතින් ඒක හින්ද සමහරවිට යම්කිසි  කවලම් වීමක් වීමටත් ඉඩ තියෙනවා ගිය සතියේ කියා දීපු ටිකට  වඩා ඉදිරියට ගිහින් අපි සාකච්ඡා කළාද කියලත් හිතෙනවා ස්වාමීන්වහන්ස සමහර වෙලාවට. විශේෂයෙන්ම මූලිකවම ස්වාමීන්වහන්ස අපිට පැහැදිලි කරගන්ට අවශ්‍යතාවයක් තිබුනේ 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' ගැන අහගන්ට තිබුනේ. මම හිතන්නේ නෑ එතරම් දුරට අපි ගිය සතියේ ගියා කියල. ඒ ප්‍රශ්නේ ඇහුවට කමක් නැත්ද සවාමීන් වහන්ස.  තෙරුවන් සරණයි!

<u>ස්වාමීන් වහන්සේ</u> - 'පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය' ගැන අපි කථා කරමු. හොඳයි අහන්ටකෝ බලන්න. අපි උත්සාහදරමු.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස  අපිට ඇත්තටම දෙතැනකින්  දෙවිදියකින් මේ පිළිබඳව අහන්න ලැබෙන හින්ද පැහැදිලි කරගෙන යමු කියල අදහසක් තිබුන. ඒ කියන්නේ 'පටිසම්භිදාමග්ගපාළියෙහි' සැරියුත් ස්වාමීන්වහන්සේ දේශනා කරලා තියෙනවා අර **'අහුත්වා සම්භූතං, හුත්වා න භවිස්සතීති'** කියල අජ්ඣත්ත ආයතන ගැන කථාකරන කොට. එතකොට හිතෙනවා - 'දකින කොට ඒ වෙලාවෙමයි ඇස කියන එක හටගන්නේ' කියල. එහෙම නමුත් අපිට මෙතෙන්දි නිශ්‍රය ප්‍රත්‍යයයේදී කියනවා චක්ඛායතනය කියන එක ඇත්තටම පුරේජාත විදයටයි ප්‍රත්‍යය වෙන්නේ කියල, චක්ඛු විඤ්ඤාණයත් ඒවගේම චක්ඛු විඤ්ඤාණයේ තිබෙන අනෙකුත් චෛතසිකන් ඇතිවීම සඳහා. ඒ පිළිබඳව තමයි සවාමීන් වහන්ස  එක ප්‍රශ්නයක්. ඒක ඉස්සෙල්ල ඉදිරිපත් කරන්නම් තව ඉදිරියට අනිත් ප්‍රශ්න ඉදිරිපත් කරන්නම්. තෙරුවන් සරණයි!

<u>පිළිතුර </u>- පටිසම්භිදා මාර්ගයයි මෙතැන පට්ඨාන ධර්ම විස්තරයයි - සූත්‍රාන්තික ක්‍රමයයි අභිධර්ම සියුම් ක්‍රමයයි දෙකේ පැති දෙකක් තිබෙනවා. සමහර කරුණු එකට ගැලපී යනවා සමහර කරුණු හැප්පීම් සහගත ස්වභාවයක් තිබෙනවා. හේතුව, ධර්මයේ වෙනසක් නෙවෙයි අවස්ථාවල වෙනස නිසා. ඒකෙ ප්‍රශ්නය පුරේජාත භාවය ගැනයි.  පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය ගැන තමයි ඔය කියන්නේ. <u>ස්වාමීන්වහන්සේ</u> - මහත්තයට ගැටළු සහගත තැන හැටියට මොකක්ද ඒ කථාවේදී උනේ? කොයි හරියේද උනේ?

ඔව් ස්වාමීන්වහන්ස මේ **'වත්ථුනානත්තඤාණය'** කියන තැනේදී පටිසම්භිදාමග්ගයෙහිදී දේශනා කරනවා අජ්ඣත්ත වස්තූන් ගැන කථා කරනකොට පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා කියල. එතකොට හිතෙනවා දැන් චක්ඛු විඤ්ඤාණය ඇතිවෙන වෙලාවේම තමයි එහෙමනම් ප්‍රසාදය කියන එක ඇතිවෙලා නිරුද්ධ වෙනවා වගේ අදහසක් එනවා. නමුත් දැන් අපි නිශ්‍රය ප්‍රත්‍යය ගැන කථා කරන අවස්ථාවේදී අපිට තේරෙනවා චක්ඛු ප්‍රසාදය කියන එක පුරේජාත වශයෙන් තමයි නිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියල. ඒ කියන්නේ චක්ඛු විඤ්ඤාණය ඇතිවෙන්න කලින්ම ඇතිවෙලා තිබුන දෙයක් හැටියට චක්ඛු ප්‍රසාදය කියන එක. එතකොට ඒ දෙකේ යම්කිසි විදියක නොගැළපීමක් වගේ දෙයක් - ඒ කියන්නේ නොගැළපෙනවා නෙමෙයි. ඒක අපිට අවබෝධ කරගැනීමට තරමක අපහසුතාවයක් තියෙනවා ස්වාමීන් වහන්ස.

<u>සවාමීන් වහන්සේ</u> - හොඳයි, අපි ඉස්සරවෙලා අපි මේ කාරණය හොඳට වැටහේවා කියල මම පළමුවෙන්ම ආශීර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා. අභිධර්මය හරියට යන්න ඉස්සරවෙලා මම හිතනවා මෙන්න මෙහෙම. අවස්ථා දෙකක්. එකක් තමයි අපි හිතමු අපි භාවනා කරනවා කියල. භාවනා කරනවා කියන තැන ඉන්නකොට සාමාන්‍ය කෙනෙකුට තේරෙන්නේ ක්‍ෂණ පච්චුපන්නය නෙමෙයි. සාමාන්‍ය කෙනෙකුට ක්‍ෂණ ගොඩකින් එකතු වෙච්ච සන්තතියක් තමයි අහුවෙන්නේ. බුදුරජාණන්වහන්සේගේ බුදු හිතට අර ක්‍ෂණය හොඳට අහුවෙනවා උන්වහන්සේගේ හිතේ වේගය වැඩි නිසා. සාමාන්‍ය කෙනෙකුට තේරෙන්නේ පුංචි පුංචි ක්‍ෂණ වලින් පුංචි පුංචි චිත්තක්‍ෂණ වලින් පේළි ගැහිච්ච - පුංචි පුංචි චිත්තක්‍ෂණ වලින් ගොඩවෙච්ච එක එක රාමු - එක එක ගොඩවල් - එක එක පේළි. පේළි වශයෙන් ගත්තයින් පස්සේ මහා රංචු - රංචු - රංචු තමයි ඔය ධර්‍ම පේන්නේ. ගොඩාක් සූත්‍ර දේශනාවල රංචු - පේළි - පරම්පරා - ධර්‍ම තමයි තියෙන්නේ, දේශනා කරන්නේ සහ ඒක ලොකු අරමුණු හැටියට අරගෙන තේරුම් ගන්න පුළුවන් එකක්. දැන් අපි හිතමු, මනසිකාරය පවත්වන කොට අපි ඒ වෙලාවේ - ඒ ක්‍ෂණයේ මෙනෙහි කරගෙන යනකොට අපිට පේන්නේ ඉස්සරවෙලා පහළ වෙච්ච එහෙම නැත්නම් එතනම තිබෙන්නාවූ ධර්‍ම රංචුවකට ගොඩකට තමයි අපේ හිත නිකං පෙරලිලා පැතිරිලා වගේ තමයි දර්ශනය වෙන්නේ. ඕක තමයි අවබෝධයට යන කොට ඇතිවෙන්නාවූ නියම අපි අත්විඳින තත්වය. දැන් අපි ධර්‍මයට යන කොටනේ අපි ක්‍ෂණය බලන්නේ. අපෙන් කෙනෙක් ඇහුවොත් එහෙම 'ඔබ ඊයේ හොහෙද හිටියේ' කියල අපි කියනවා අහවල් තැන හිටිය කියල. 'අහවලා හම්බුනාද දැක්කද?' 'දැක්ක හම්බුනා'. එතකොට ඊයේ ගැන කියනවා - ඊයේ වෙච්ච දෙයක් ගැන කියනවා. අපිට හොඳට මතකයි. අපිට ඒ වෙලාවේදී කල්පනාවක් එහෙම නැත්නම් මේ ඊයේ ඇතිවෙච්ච ඇහෙන් ඊයේ දැක්ක - ඒක නැතිවෙලා ගියා - දැන් මේ අද වෙන ඇහැකින් කියල - ඔය කල්පනාව කොහොමවත් ඇතිවෙන්නේ නෑ.

විදර්ශනාවට ගියාට පස්සේ අවබෝධයෙන් අපි යම්කිසි තැනකට එනකොට එතැනදී 'ආ මෙහෙම මෙහෙමයි ඕක කැඩි කැඩී ගියේ' කියල හිතාගන්නව ඇරෙන්න සාමාන්‍යයෙන් අර විදියට වෙන්නේ නෑ. එතකොට අපි දන්නවා මේ ඇහැ ඉස්සෙල්ල තිබුන - ඒ ඇහෙන් අපි

දැක්ක - ඒවගේම ඒකෙන් පින්තූර දකිනවා - ඒකෙන් අදත් දකිනවා කියල සාමාන්‍යයෙන් අපි ඇහැ ගැන හිතාගෙන ඉන්නවා. ඒ විදියට තියෙනවා කියල හිතාගෙන ඉන්නවා සහ ඒ විදියට තමයි අපිට හොඳට දැනේන්නේ.

ඇතුලත ක්‍ෂණයේ භංගයක් තිබෙනවා හැබැයි අපිට ඒ ක්‍ෂණභංගය අහුවෙන්නේ නෑ. දේශනා වශයෙන් අහනකොට න්‍යායකින් අපි තේරුම් ගන්නවා - ඒවාගේම ගැඹුරුම විදර්ශනාවකට රිංග ගත්තොත් එහෙම ඒ ටික සන්තති පරම්පරා වශයෙන් අහුවෙනවා. ඒක නිසා අර **'අහුත්වා සම්භූතං'** කියන කොට ඒකටත් ගැළපෙනවා. හැබැයි ඔය පේන්නේ නැති ධර්‍ම න්‍යායට ගිහිල්ලා බලනකොට මෙන්න මෙහෙම එකක් වෙනවා. අපි මේ ක්‍ෂණයේ - දැන් මේක කවුරුත් දකින එකක් නෙමෙයි - මේක කාටවත් එහෙම පේන එකක් නෙමෙයි. මේක ධර්‍ම න්‍යායක පිහිටලා අපි මනසිකාරයෙන් නිකං අල්ලන්න යන එකක් මේක. එකේ මේ විදියට වෙනවා.

දැන් අර චක්ඛු විඤ්ඤාණය කියල එකක් තියෙනවනේ, චක්ඛු විඤ්ඤාණයටත් ඔය පුරේජාත නිශ්‍රය භාවය තියෙනවා. ඒ පුරේජාත නිශ්‍රය භාවය තියෙන්නේ මෙහෙමයි. චක්ඛු විඤ්ඤාණය කියන එක වෙනකොට - ඉස්සරවෙලා අරමුණක් හැදිලා තියෙන්ටත් ඕනෑ - ඒවගේම වස්තුවක් හැදිලා තියෙන්ටත් ඕනෑ. අපි හිතමු චක්ඛු වස්තුව හරි - හෘදය වස්තුව හරි - දර්ශනය වන ආරම්මණ වස්තුව හරි ඔය ටික තියෙන්න ඕන. එහෙම තියෙන කොට අපි හිතමු මෙහෙම. චිත්ත වීථියක් පටන් ගන්න කොට භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංචද්වාරාවජ්ජන - චක්ඛු විඤ්ඤාණ - සම්පටිච්ඡන - සන්තීරණ - වොත්තපන - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - ජවන් - තදාරම්මණ - තදාරම්මණ - භවාංග - ඔය පේළිය ගතවෙන කොට අරමුණු වන්නාවූ රූපය, ඒ වෙලාවේම හටගන්නවා අලුත් රූපයක්. ඒ අලුත් හට ගත්ත ගමන් රූපය තමයි භවාංගයට connect වෙන්නේ. භවාංගයට ස්පර්ශ වෙන්ට ලංවෙන්ට කිට්ටුවෙන්ට තියෙන්නේ - අරමුණ හැටියට. ඒ එක්කම ඒ අරමුණ ගන්ට පහළ වෙන්නාවූ වස්තු රූපය ගත්තම ( මොකක් හරි ආයතන වස්තු රූපය) එතනත් තිබෙනවා හොඳට පණ ඇති ඒවගේම හොඳට ශක්තිය තිබෙන්නාවූ රූප කාණ්ඩයකට තමයි ඒක වදින්නෙත් සහ ආධාර වෙන්නෙත්. දැන් මේකේ බලන්ට - මෙතන හොඳට අහගන්න. චිත්තක්‍ෂණ 17 ක් තිබෙනවා සිත් පේළියේ. ඒ චිත්තක්‍ෂණ 17 සිත් පේළිය පටන් ගන්න කොට ඒ පටන් ගන්න අවස්ථාවේදීම තමයි ඔය ආරම්මණ වස්තුව හට ගන්නේ. දැන් ඒක පරණ වෙලා එනවා. භවාංගයෙන් චිත්තක්‍ෂණයක් එනකොට ඔන්න ඒ අරම්මණයේ හරි වස්තුවේ හරි එක චිත්ත ක්‍ෂණයක් පරණයි - දෙවෙනි එකට එනකොට දෙකක් පරණයි - තුන්වෙනි එකට එන කොට තුනක් පරණයි - හතරවෙනි එකට එනකොට හතරක් පරණයි - දැන් එතකොට මේ චක්ඛු විඤ්ඤාණය කියන එක - ඒ මනෝධර්‍මය අරමුණ ගන්න කොට - අරමුණ දැන ගන්න කොට ඒ චක්ඛු විඤ්ඤාණය පහළ වෙන්නේ අර චක්ඛු ද්වාරික වස්තුව චිත්තක්‍ෂණ කීපයක් පරණවෙලා - ඉස්සර වෙලා පහළ වෙලා - ඊට පස්සේ පරණ වෙච්ච (ඉස්සරවෙලා පහළ වෙන්න එපාය) ඒකෙ පුරේජාතය ඉස්සෙල්ල ඇති උනා - ඒකක මැද්දැවක පිහිටලා අඩිය ගහගෙන තමයි අනිත් අරමුණු කිරීමට හැකිවෙන්නේ. ඒක නිසා

එතන චිත්තක්ෂණ වශයෙන් ගත්තයින් පස්සේ චිත්තක්ෂණ 5 ක් පරණ වෙච්ච එකක්. ඒක ඇවිල්ල හොඳට ශක්ති සම්පන්න වෙනවා. නිශ්‍රය භාවය හොඳට තිබෙනවා. ඒ නිසා පුරේජාත නිශ්‍රය භාවය ඒකට සලකන්න පුළුවන්, ඔය වස්තුව මේ ධර්මවලට ගලපගන්න කොට. දැන් මේක තේරුනාද කියන එක පිළිබඳ ඒ කියන්නේ චිත්තක්ෂණ ටිකකින් හරි පරණ වෙන්ට ඕන. එහෙම නැත්නම් හයිය නෑ. ඔය දැන් අපි වස්තු රූප හැටියට ගත්තයින් පස්සේ ඕව පරම්පරා වශයෙන් පහළ වෙනවා - පහළ වෙලා නැතිවෙනවා නැතිවෙලා ආයිත් පහළවෙලා නැතිවෙනවා. ඒකට අරමුණක් තිබුනත් නැතත් ඒ වර්ගයේ රූපටික පහළ වෙවී පහළ වෙවී යනවා නමුත් හරියටම අජ්ඣත්ත රූපය කියල ගන්නේ අර ඒක ක්‍රියාත්මක වෙන තැනටයි. හැබැයි එහෙම නැති උනයි කියල ඒ වර්ගයේ තිබෙන්නාවූ දේවල් පහළ නොවී තිබෙන්නේ නෑ. ආන්න ඒ විදියට මේ ධර්ම කොට්ඨාසය අපි හිතා ගන්ට ඕනෑ. අනිත් එක තමයි අපි හිතමු මෙහෙම.

කාය ප්‍රසාදය හිතන්න බලන්න. දැන් අපිට නින්ද ගියහම කාය ප්‍රසාදයට තිබෙන්නාවූ සංවේදී ස්වභාව මැරී යන්නේ නෑ.. ඒ රූප කලාප සම්පූර්ණයෙන්ම කර්මජ - ප්‍රවෘති රූප කලාප පහළ වේගෙන පහළ වේගෙන දිගට යනවා. හැබැයි හිත භවාංගයක් අස්සට රිංගගෙන නින්දේ ඉන්න හින්දාවෙන් කාය ප්‍රසාදයේ රූපය, ආයතනයක් හැටියට ඒ මොහොතට ක්‍රියාත්මක වෙන්නේ නැති එක තියෙනවා. හැබැයි හිත අවධි වෙලා ආවයින් පස්සේ හොඳට තමන්ට අවශ්‍ය රූප පරම්පරාව ප්‍රවෘති වශයන් දිගට යනවා. ඒක නිසා පරෙස්සන් වෙන්ට ඕනෑ ආයතනයක් හැටියට කථා කරන කොට ආයතන ක්‍රියාවලිය සිද්ධවෙන්නෙ ඒ මොහෙතේ තමයි හැබැයි ආයතන ක්‍රියාවලිය සිද්ධ වෙන්න පණ ඇති පරම්පරාවක් ඉදිරියට ගිහිල්ලා තියෙන්න ඕන. නැත්නම් එහෙම ඒ වෙලාවේම නිකං අලුත් ඇහැක් හැදිලා - ඒ වෙලාවේම අලුත් කනක් හැදිලා - ඒ වෙලාවේම අලුත් ........... ඒකේ පරම්පරාව ගෙනියන්න තිබෙන්න ඕනෑ ක්‍රියාත්මක කිරීමේ අජ්ඣත්තික රූපය තමයි සමහර අවස්ථාවලදී ඔය පටලැවෙන්නේ කෙනෙකුට තේරුම් ගන්න. හැබැයි ඒකෙත් නිශ්‍රය ප්‍රත්‍යයට යනකොට රූප පරම්පරාවේ චිත්තක්ෂණ 17 ක් ඇත්තාවූ රූපයේ මැද්දෑවක තමයි ඒ අදාළ විඤ්ඤාණය පහළ වෙන්නේ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස බොහොම පිං ස්වාමීන්වහන්සේගේ පැහැදිලි කිරීමත් එක්කම කර්මජ රූප වල පැවැත්ම ගැන තව ටිකක් අපිට පැහැදිලි කරගත්තනම් හොඳයි ස්වාමීන්වහන්ස. එතන ඇත්තටම ජීවිත ඉන්ද්‍රිය රූපය කියන එක කොයි විදියටද බලපාන්නේ - එතකොට ඒවගේම භවාංග සිත කියන එක කොයි විදියටද රූප ප්‍රවෘතියට බලපාන්නේ කියන එක අපිට පොඩ්ඩක් පැහැදිලි කරගන්න පුලුවන්ද ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - කර්මජ රූප සාමාන්‍යයෙන් කථාකරන කොට කථාකරන්නේ එක විදියකටයි. ඒ කියන්නේ ජීවිතයේ පවතින්නාවූ වර්ග 4 රේ රූපවල කර්මජ චිත්තජ ඍතුජ

අහාරජ කියල කොටස හතරක් බෙදා ගන්නවා හැබැයි මේ පට්ඨානයට බහින කොට මම මේ පින්වතුන්ට මතක් කරා වර්ග 7 ක් කර ගන්නවා මේ රූප. (පරණ දේශනා නැවත අහන්ට) රූප වර්ග 7 ක් කරගන්නවා. ඉස්සෙල්ලාම අර 4 'හතක්' කර ගන්නවා. හේතුව ඔය පටලැවිල්ලක් එන හින්ද. එහෙම නැත්නම් කෙනෙකුට තේරුම් ගන්න බෑ. මේ කියන්නේ කර්මජ රූප උප්පත්ති අවස්ථාවේ සහ ඊට පස්සේ පවතින අවස්ථාවේ භව දෙහෙකයි වෙන වෙන විදියට ක්‍රියාත්මක වෙන්නේ. ඒ කියන්නේ කර්මජ රූප තියෙනවා තුනක්. ඒ කර්මජ රූප තමයි

- එක කර්මජ රූපයක් starting point එකේ තියෙන්නේ. ඒකට කියනවා ප්‍රතිසන්ධිය හදන කර්මජ රූප කියල. **'ප්‍රති සන්ධි කර්මජ රූප'** ඒක අමුතුයි. අමුතු වෙන්න හේතුව ප්‍රතිසන්ධි සිත එනකොටම ඒකෙ ගැම්මට ගහ ගන්නාවූ රූපයක්. ඒක නිසා ඉස්සෙල්ල එතැන - ප්‍රතිසන්ධි රූපයට කලින් රූපයක් නෑ නමුත් එනකොටම ගහගන්න එකක් ඒක. ආන්න ඒක නිසා ප්‍රතිසන්ධි කර්මජ රූප කියල ජාතියක් තියෙනවා.

- ඊළඟට ප්‍රතිසන්ධි කර්මජ රූපයෙන් පස්සේ හැදෙනවා - ඊළඟ ඒවා විස්තර කිරීමට දානවා **'ප්‍රවෘත්ති කර්මජ රූප'** කියල - දැන් එතකොට වර්ග දෙකයි. **'ප්‍රතිසන්ධි කර්මජ රූප'** – **'ප්‍රවෘති කර්මජ රූප'**. ප්‍රවෘති කර්මජ රූප ගන්නේ ප්‍රතිසන්ධි සිතෙන් දෙවෙනි සිතේ ඉඳල ඉස්සරහට. ඒකෙ තියෙනවා - දැන් භවාංග සිත තිබුනට අපිට නොදැනුනාට ඒ සිතෙනුත් අපේ ජීවිතේ ඇතුලේ චිත්තක්ෂණයක් ක්ෂණයක් ක්ෂණයක් ක්ෂණයක් ගානේම කර්මජ රූප පරම්පරාවල් පරම්පරාවල් දිගටම චිත්තක්ෂණ 17 ආයුෂ තිබෙන්නාවූ රූප හදාගෙන හදාගෙන හදාගෙන යනවා. එන හැම එකේම හදනවා. ඒ set එකට කියනවා **'ප්‍රවෘති කර්මජ රූප ස්වභාවය'** කියල.

- අනිත් කර්මජ රූපය තමයි හිතක් නැති - නාම ධර්මයක් නැති - භවාංගයක් ස්පර්ශ කරන්නේ නැති - චෛතසිකක් ආධාර කරගන්නේ නැති - නමුත් හුදු කර්මයෙන්ම රූපය හටගෙන ඊට පස්සේ කර්මයෙන්ම නැතිවෙලා යනවා හැබැයි එතෙන්ට කිසිම නාම ධර්මයක් ස්පර්ශ වෙන්නේ නැති **'අසංඥ සත්ව කර්මජ රූප'**. ඔය තමයි කර්මජ රූප වර්ග 3.

ඒක තුනක් කරගත්තේ මේ ධර්ම වල තිබෙන්නාවූ පටලැවිල්ල නිරාකරණය කරගැනීම සඳහා. හැබැයි ඔය විදියටම තමයි ඒක තියෙන්නේ. දැන් අපිට කර්මජ රූප තියෙනවා. තව එකක් තමයි භවාංග සිතක් සිතක් ගානේ හැදෙනවා කර්මජ රූපයක් - දැන් ඕක ඇවිල්ල විපාක සිතක් නෙ. ඔය විපාක සිතට සමාන්තරව හැදෙනවා කර්මජ රූපයක්. දැන් ප්‍රතිසන්ධි සිත ඇවිල්ල කර්මයක විපාකයක්නෙ. විපාකයට අනුකූලව හැදෙනවා රූපයක්. ඊට පස්සේ එක චිත්තක්ෂණයක් චිත්තක්ෂණයක් පාසා හැදෙනවා කර්මජ රූප. (සමහර සිත් වල හැදෙන්නේ නෑ) ඒ කර්මජ රූප පරම්පරාවේ එක තැනක් තමයි ඔය අපිට අහුවෙන්නේ

ඔය වස්තුරූපය ආශ්‍රය කරාට. අනිත් එක තමයි, මම හිතන්නේ එතන නේද ඇහුවේ මහත්තය?

එහෙමයි ස්වාමීන් වහන්ස එතන - මෙහෙමයි දැන් කර්මජ රූප කියල ටිකක් තියෙනවා. නමුත් ඒකට කෙලින්ම සම්බන්ධයක් තියෙනවාද කියල භවාංග සිත කියන එක තමයි විශේෂයෙන් දැන ගන්න ඕන ස්වාමීන්වහන්ස. ඒකට හේතුව උනේ අපි දන්නවා අර නිරෝධ සමාපත්තියෙහිදී සිත් පහළ නොවෙන වෙලාවෙදීත් කර්මජ රූපයට කිසිම හානියක් නොවී දිගටම පැවතුනා කියන එක. ඒක නිසා හැම භවාංග සිතක් ඇතිවෙන කොටම කර්මජ රූප ඊට සමානතරව ඇතිවෙනවා නමුත් මේ දෙක අතර සම්බන්ධයක් තියෙනවාද කියන එක තමයි විශේෂයෙන්ම දැනගන්න ඕන ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - තියෙනවා, ඒ කියන්නේ නිරෝධ සමාපත්ති අවස්ථාවේදී චිත්තජ රූප නෑ. ඒකට හේතුව චිත්තජ රූප හැදෙන්ට නම් සිතක් පිහිටන්ට ඕනෑ. කර්මජ රූප පරම්පරාව හිත තිබුනත් යනවා හිත නැතිඋනත් යනවා. ඒකට හොඳ ස්ථානයක් තමයි ඒ. නිරෝධ සමාපත්තියට එනකොට හිත නැතිවෙනවනේ. ඒ හිත නිවී ගිහිල්ලා ආයි ක්‍රියාත්මක වෙනකොට එතන ඉදල ගන්ට ශක්ති සම්පන්න ස්වභාවයක් එකේ තියෙනවා. ඒකේ ආයේ ප්‍රවෘති කර්මජ රූප නැතිවෙන්න් නෑ. දිගටම ආපහු ඇවිල්ල ඊට පස්සේ හිත ක්‍රියාත්මක වෙලා නැවත බලන්ට - දකින්ට - අහන්ට අවශ්‍ය කරන්නාවූ පරම්පරාව එතන තියෙනවා. ඒකෙ කිසි ප්‍රශ්නයක් නෑ. ඒක හොඳට තේරෙන එකක් තමයි දැන් බලන්ට අසංඥ තලයේ කර්මජ රූප. හිතක් පහළ වෙන්නේ නැතුවනේ තියෙන්නේ. කිසිම විදියක හිතක් පහළ වෙන්නේ නැතුව පරම්පරාව ගෙනියනවා.

එහෙමයි සවාමීන්වහන්ස මම අවසාන ප්‍රශ්නෙ ඇහුවේ දැන් අපිට සිතක් පහළ වෙනකොට අපි දන්නවා සිතත් එක්කම චෛතසික ධර්මයන් පහළ වෙනවා. එතකොට එතෙන්ට නිශ්‍රය ප්‍රත්‍යය යෙදෙනවාද කියන ප්‍රශ්නයට අපිට පිළිතුරක් දුන්නොත් බොහොම පිං ස්වාමීන්වහන්ස. එතන චෛතසික සිත් නිශ්‍රය කරගෙන ඉන්නවද නැත්නම් ඒ සිත චෛතසික නිශ්‍රය කරගෙන ඉන්නවද කියල වගේ ප්‍රශ්නයක් ඇහුවොත් ඒකට කොයි විදියටද උත්තර දෙන්නේ කියල ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඒකෙ, නිස්සය ප්‍රත්‍යයයේදී මම ඕක කියල දුන්න නේද ගිය සතියේ මහත්තය. වර්ග දෙකක් කියල දුන්න. ඒ කියන්නේ යම් කිසි ධර්මයක් හට ගන්ට ඒ තුල පිහිටා තියෙන්ට හේතුවෙන්නාවූ ස්වභාවය grounding ගතිය තමයි නිස්සය ධර්මයේ තිබෙන්නාවූ - නිස්සය ස්වභාවයේ තිබෙන්නාවූ ගුණය සහ ශක්තිය. ඒකෙන් ඊට පස්සේ මම කියල දුන්න, ඒක සිද්ධ වෙනවා - එක අවස්ථාවකදී සහජාත ස්වභාවයෙන් සිද්ධ වෙනවා අනිත් ක්‍රමයේ හැටියට යමක් ඉස්සරවෙලා පසුව ඇතිවෙන්නා වූ දේට ඒදේ බලපානවා - උපකාරවෙනවා වෙනවා කියලා. ඊට පස්සේ අපි කිව්වා නාම ධර්ම හැටියට පවතින ප්‍රධාන ධර්මවස්තුව 'සිත' ඊළඟට ඒකත් එක්ක ගැට ගැහී සහසම්බන්ධ වී එන්නාවූ ධර්ම රාශිය 'චෛතසික ධර්ම' - එතකොට ඒ චෛතසික ධර්මයන්ට ආධාර වෙනවා ප්‍රතිසන්ධි අවස්ථාවේදී වස්තු රූපයත්

අධාරවෙනවා වෙනවා කියල කිව්වා රූපය හැටියට ඊළඟට ඒකෙ චිත්ත චෛතසික ධර්මයන් - නාමධර්මයන් නිශ්‍රය වෙනවා කියල අපි කිව්වා නේ?

එහෙමයි ස්වාමීන්වහන්ස එහෙමයි **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො'** කියන තැන කිව්වා.

<u>ස්වාමීන් වහන්සේ</u> - හැබැයි තව එකක් මෙහෙමත් තේරුම් ගන්ට. එකක් අර රූප ධර්මයනුයි නාම ධර්මයනුයි ප්‍රත්‍යය වන ආකාරය කියන්නේ - එක අවස්ථාවකදී විතරක් කියනවා. නැත්නම් අනිත් ඒවා ටික මහත්තය වෙනමයි කියන්නේ. ඒ කියන්නේ එකටම වෙන්නේ නෑ. සමහර ඒවා තියෙනවා ඒ නිස්සය වීම වෙන වෙනම වෙනවා. ඔය ස්කන්ධ හැටියට කථා කරන කොට **'චත්තාරො ඛන්ධා'** කිව්වේ නාම ධර්මයන් ටික. ඒ නාම ධර්ම ටික වෙන්නේ ඔවුනොවුන්ට, හැම එකකටම නිශ්‍රය වෙනවා - උපකාරයක් වෙනවා ඒක නිසා - **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො'** කියල කියනවා. එතකොට ඔවුනොවුන්ට හේතුවෙනවා කියල කිව්වයින් පස්සේ ඒගොල්ලෝ ඔක්කොම නියෝජනය වෙනවා. ඊට පස්සේ කිව්වනේ අපි **'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො'** කියල එතකොට අර නාම ධර්ම කිට්ටුකර ගන්නේ නැතුව සතර මහාභූත ධර්මයෝ විතරක් එතනදී කොටස් කරලා ඔවුනොවුන්ට නිශ්‍රය වෙනවා. අපි ඔය නිශ්‍රය ප්‍රත්‍යය ගැන කියන කොට එතනදී වචනයක් භාවිතා කලා ඒ තමයි **'අඤ්ඤමඤ්ඤං'** කියල. ඒ කියන්නේ අන්‍යෝන්‍යය වශයෙන් - එතකොට නාම ධර්මයකට අන්‍යෝන්‍යය වශයෙන් කියන වචනය දැම්මයින් පස්සේ ඔවුනොවුන්ට සාමූහික වශයෙන් හැම එක්කෙනාම කෙනෙකුට උදව්වකුත් කරනවා - ප්‍රධානත්වයකුත් ලබාදෙනවා වගේම - උදව්වක් කරනවා වගේම තමනුත් උදව්වක් ගන්නවා. 'රූප ධර්ම' අතරෙත් ඒක තියෙනවා 'නාම ධර්ම' අතරෙත් තියෙනවා.

විශේෂත්වය හැටියට කියල දුන්නේ ඒගොල්ලන්ගේ නාම ධර්ම වෙනස් උනත් රූප ධර්ම වෙනස් උනත් යම්කිසි සම්බන්ධතාවයක් ඔවුනට තියෙනවා කියන තැන විතරක් කිව්වේ අර **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො'** කියන ප්‍රතිසන්ධි අවස්ථාව ගැන කියන තැන විතරයි. මේක මම හිතන්නේ අපේ පින්වතුන්ට වැටහෙනවද? මහත්තයට නම් යම්කිසි කොටසක් තේරෙනවා දැනෙනවා කියලනම් මට හැඟීමක් ඇතිවෙනවා. අනිත්අයටත් එහෙමදැයි කියන එක පිළිබඳව දැනගන්න තියෙනවා නම් ඒකත් හොඳයි.

බොහොම හොඳින් තේරුණා ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි සියලු දෙනාටම අවසරයි සවාමීන්වහන්ස ඔබ වහන්සේ දැන් මෙතෙක් වෙලා පැහැදිලි කරපු දේවල් වලින් ගොඩක් කරුණු එක්තරා මට්ටමකට පැහැදිලි උනා හොඳට. ගිය සතියෙත් ඔබවහන්සේ පැහැදිලි කරලා දුන්න පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයයේදී උදාහරණයක් ලෙස ඔබවහන්සේ දැක්වුවා බිත්තියක චිත්‍රයක් - ඒ කියන්නේ බිත්තිය කියන එක තිබිලා චිත්‍රය පසුව ආව. එතකොට ඒක පසුව පහළ වෙච්ච දෙයක් කියල තමයි කථා කලේ. ඒකේ දෙවෙනි උදාහරණය ලෙස ඔබවහන්සේ ප්‍රකශ කළා

ස්වාමීන්වහන්ස මේ කන කියන එක. මේ කන කියන එක පුරේජාතයි ඒ කියන්නේ කන කලින් පහළ වෙලා - ඒකියන්නේ අපිට මේ පේන - අතට අහුවෙන මස් කන නෙමෙයි මම හිතන්නේ එතකොට ඒ කියන්නේ ප්‍රසාදය. ඒ කියන්නේ ප්‍රසාදය ප්‍රසාදවත් වෙලා තියෙනවා සද්දයක් කියන එක ආවහම පසුව තමයි පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙන්නේ. එතකොට එහෙමනම් කොහොමද දැන් සද්දය කියන එක එළියේ නැහැ නමුත් අපි හදාගත්තු සද්දයක්නේ තියෙන්නේ ස්වාමීන්වහන්ස. එතකොට හදාගත්තු සද්දය එන්නේ කලින් ගත්ත නිමිති අනුව. එතකොට කලින් නිමිත්තක් කියන්නේ අපිට මීට පෙර ඒ අහපු සද්දයක් තමයි මනසට ඇදිල එන්නේ පෙර තිබ්ච්ච. ඒකනිසා අපි කියනවා දැන් මේක කපුටෙකුගේ සද්දයක් කියල චිත්ත රූපයක් මවා ගන්නවා. එතකොට කොහොමද ස්වාමීන් වහන්ස එතන පැහැදිලි වෙන්නේ, මේ ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරපු පුරේජාත නිස්සය ප්‍රත්‍යයත් එක්ක සම්බන්ධ කරලා ගන්නකොට ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඒකෙ මහත්තය මම පාවිච්චි කරා පෙර ස්වාමීන්වහන්සේලා පවිච්චි කරපු ලස්සන උදාහරණයක්. ඒ තමයි අර සහජාත භාවයටයි පුරේජාත ප්‍රත්‍යය ස්වභාවයටයි. සහජාතභාවයට පාවිච්චි කරා පිරිත් මණ්ඩප්පයක්. ඒ ගොක්කොළවල රටා දදා වියනවනේ. එතකොට ඒකෙ රටාව කියල කියන්නේ ඒක චිත්‍රයක්නේ. පැදුරක් - ගොක්කොළ විවීමක් - ඒක art එකක් - කලාවක් - පින්තූරයක් තියෙන්නේ - හැබැයි ඒ පැදුර වියන ගමන්ම පින්තූරය මතුවීම සහජාත ස්වභාවය වගේ. එතකොට ඉස්සෙල්ලා ඕකේ පින්තූරයක් තිබුනේ නැහැ. පැදුර වියන ගමන්ම තමයි ඒ පින්තූරේ මතු උනේ. ඔන්න සහජාත ස්වභාවයට ගත්ත උපමාව. හැබැයි කොළේක චිත්‍රයක් අඳින කොට චිත්‍රය පස්සේ එන්නේ කොළේ මතට හැබැයි කොළේ ඉස්සෙල්ල හටගන්නවා. ඔන්න ඒක.

හැබැයි ඊට පස්සේ මම කිව්වා ශබ්දය ගැන. ශබ්දය මහත්තය ඉස්සර වෙලා තිබ්ච්ච ශබ්දයක් නෙමෙයි. අපි කිව්වට ඉස්සෙල්ල ශබ්දයක් කියල - දැන් අපි මේ වෙලාවේ මහත්තයල මගේ කටහඬ අහනවනේ. මේ කටහඬ - මේ ශබ්ද දැන් කථාකරන හඬ - මේ වචන - ඉස්සර තිබ්ච්ච එකක් නෙමෙයි. මේ අලුතෙන් අලුතෙන් තමයි මේ හඬ නිකුත් කරන්නේ. එතකොට මේ හඬ නිකුත් වෙනකොට මේ අද අහන වචන ටික ඉස්සෙල්ල අහල මහත්තයල හිතේ දරාගත්තු එකක් නෙමෙයිනේ.

මේකේ මෙහෙම එකක් තියෙනවා. මහත්තය හිතන තැන මට තේරෙනවා. දැන් මම කථාකරගෙන යනකොට ලෙඩක් දුකක් අසනීපයක් හෙම්බිරිස්සාවක් නැතිතාක් කල් මේ වචන වල තිබෙනවා - ඒ කථාකරන ස්වරූපය - උගුර - දැන් හුරුවෙලානේ තියෙන්නේ ඒ ඒ මාංශ පේශීන් ඒ ඒ ශබ්ද නිකුත් කරන්න. ඒක නිසා ඒ හරියෙන් යනකොට හැමවෙලාවෙම පෙර ශබ්දයට සමාන සද්දයක් එන බව හැබෑව. පෙර ශබ්දයට වගේම ඊයේ කතාකරපු හඬට සමානයි. ගිය සතියේ කථාකරපු හඬට සමාන හඬක් තමයි එන්නේ. හැබැයි ඒකේ **'සමාන හඬ'** කියන එකයි **'එකම ශබ්දය'** කියන එකයි කාරණා **'දෙකක්'**. හැබැයි ඊයේ කථා කරපු වචනෙම නෙමෙයි මේ. ඊයේ කථා කරපු වචන වල ඒ සද්දයේ හඬට අද කථා කරන හඬ එක ළඟ සහ සම්බන්ධ නෑදෑ කමක් හඬේ වශයෙන් තිබුනට ඊයේ කථාකරපු වචනයම - සද්දයම

- හඬම නෙමෙයි. ඒක නිසා සද්දය නෑ. දැන් අපි සද්දයක් අහන්නේ දැන් මේ මහත්තයල මේ සද්දේ අහන්නේ දැන් නිකුත් කරන වර්තමාන - අමු අමු ශබ්දය ඇහන්නේ දැන්. ඒ සද්දය අහන කොට මහත්තය කිව්වනේ ඉස්සෙල්ල 'හිතේ දරාගෙන ඉන්නව කියල එකක්', ඒ හිතේ දරාගෙන ඉන්නේ ශබ්දය නෙවෙයි. ශබ්දයට දීපු දෘෂ්ටි - අදහස් - මතක සංඥා ටිකයි ඔය හිතේ පැලපදියන් වෙලා, ඒක ඉස්සර වෙච් ඉස්සර වෙච් තමයි අර සමාන සද්දය කියල බාර ගන්නේ. ඔය ඉස්සෙල්ලා කථා කරපු එක වශයෙන් ඒක බාරගන්නේ ඒ විදියට.

ඒක නිසා මෙතැන තිබෙනවා හැඩ තල කීපයක්. එකක් තමයි ශබ්දය කියන එක ඊයේ තිබෙන ශබ්දය නෙමෙයි - ඒක එකක්. අනිත් එක ඊයේ කථාකරපු ඒ නිකුත් කරපු ශබ්දයට සමාන ගතියකින් යන සද්දයක් කියන බව - ඒක එකක්. එහෙම ඇත්තක් තියෙනවා. එකම සද්දය නෙමෙයි. ඒක නිසා ඊයේ කථාකරපු ශබ්දය මේකයි කියල හඳුනා ගන්නේ අර සද්දය සම්බන්ධයෙන් දීල තිබෙන්නාවූ මතක සංකල්පනා ආධාරයෙන්. දැන් ඒ සද්දය ඇතිඋනා නැතිවෙලා ගියා. එහෙමයි තියෙන්නේ. හැබැයි අපි ශබ්දයක් අහන වෙලාවේදී වැඩිපුර හිතන්නේ නැතුව 'ආ මේ අහවල් එක්කෙනයි කථා කරන්නේ කියල' බාර ගන්නේ අර සංඥාව - මතකය පොඩ්ඩක් ඒකට උදව් කරනවා අහකට යන්ට නොදී. හැබැයි සමහර වෙලාවට තියෙනවා මෙහෙම - අපි කථාකරනකොට මෙහෙම - පොඩ්ඩක් අසනීප වෙලා ඊළඟට උගුර පොඩ්ඩක් එහෙ මෙහෙ වෙලා කථා කරනවනේ. ඒ වෙලාවට ඔය ටෙලිෆෝන් කරන කොට එහෙම මිනිස්සු අඳුරන්නෙ නෑ. ඊට පස්සේ මේ ඉස්සෙල්ල කථාකරගෙන අපු එක්කෙනා අහනවා 'කවුද ඔය කථාකරන්නේ' කියල. එතනදී තියෙන්නේ ඒ කථා කරන එක්කෙනා අසනීප වෙච්ච එකත් හැබෑව. එයා අලුතින් ශබ්දයක් නිකුත් කරන එකත් හැබෑව, හැබැයි වෙලා තියෙන්නේ එයාමේ අලුතෙන් කථාකරන කථාවේ එන සද්දය පෙර එයාගේ සද්ද වලට සමාන නැති හින්දයි අහන්නෙ 'ඔය කථාකරන්නේ කවුදැ'යි කියල. ඒක නිසා සද්දයේ අසමාන ස්වාභවයක් තියෙනවා. අපි යම්කිසි ශබ්දයක් ඇහුනයින් පස්සේ ඒකට හිතින් හදා ගන්නවා පුරුදු ගතියක් අහල අහල. ආන්න ඒක ඇවිල්ල ආසේවන ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙන්නාවූ ස්වාභවයක්.

තව එකක් කියන්ට ඕන මෙහෙම. දැන් ඔන්න මේ දවස්වල මහා ආන්දෝලනයක් යනවා උඩ අහසේ ශබ්ද තියෙනවලු. විශ්වයේ. දැන් ඒවා ඔක්කෝම එකතු කරන්ට යනවලු. එකතුකරලා filter කරන්න යනවලු. filter කරලා බුදුරජාණන්වහන්සේ දේශනා කරපු වචන තෝරලා ඒ බණ දැන් නැවත ගන්ට යනවයි කියල දැන් විද්‍යාවට තැන දීල ඔහොම ගොඩාක් කථාකරා. ඉතින් මමත් එක්කත් කථාකරා. මේක අපේ මහත්තයලත් අහල ඇති. අපේ පින්වතුනුත් අහල ඇති. විශ්වයේ තියෙනවලු ශබ්ද, ඒවා එකතු කරලා දැන ගන්න හදනවලු මොකක්ද හදල. මේකෙදි විද්‍යාව යම්කිසි දෙයක් හොයාගෙන තියෙනවා. ඒ ටිකට ඉතින් අපි හොයාගත්ත අයට යම්කිසි කෘතවේදත්වයක් දක්වල ඔය අසනීපයක් හැදුනයින් පස්සේ බෙහෙත් ටිකක් එහෙම බොන එක පින් සිද්දවෙනවා. ඉතින් මේක හොඳයි. යන්ත්‍ර සූත්‍ර හදාගෙන තියෙනවා, ඒවා හොයාගත් අයට පින්සිද්ද වේවා! හැබැයි ඔක්කොම ජාති කරන්ට

බෑ ඕකෙන්. ඔය ශබ්ද කවදාකවත් විශ්වයේ රැඳිල නෑ. කවදාකවත් විශ්වයේ ශබ්ද කියන ජාති රැඳිල නෑ - ශබ්දය ඇතිඋනා නැතිවෙලා ගියා. ඒකයි ඒකෙ ධර්මය. ශබ්දය එක්කාසු කරන්න එක් තැන් වෙලා තිබෙනවා නම් අනිත් සියල්ලම අනිත්‍යයයි සද්දය නිත්‍යයයි. පස්සේ කාලෙක හදන device එහෙකට එකතු කරගන්න පුළුවන් කම තියෙන්නේ ඒකයි. ඕක ධර්ම විරෝධීයි. කවදාකවත් එකතු කරන්න ශබ්දයක් අහුවෙන්නෙත් නෑ. ඕක කරගන්ටත් බෑ. අනිත් එක තමයි ඔය වගේ අමුතු අමුතු දේවලුත් එනවා. ඒ නිසා අපි හොඳට මේ දහම් ඇස ගත්තයින් පස්සේ ක්ෂණයක් ක්ෂණයක් ගානේ වෙනස් වේවී වෙනස් වෙවී යන්නාවූ මේ ධර්ම රාශියේ ආයිත් වෙන කාටවත් පස්සේ බාස්කට් වලට බකට් වලට එකතු කරන්ට සහ ඊළඟට ඔය record කර ගන්නවත් මොකක්වත් ඉතුරු වෙන්නේ නෑ. ඒවා නැතිවෙලා යනවා. වෙන එකක් තමයි ඕකේ තියෙන්නේ. ඒක නිසා මහත්තය සද්දය කියන එක අපේ හිතේ නෑ. සද්දය නෙමෙයි ඉස්සෙල්ලා අහපු සද්දයකින් අපි දාගත්ත යම්කිසි අදහස් මාත්‍රයක් විතරක් අපේ හිතේ ඇඳී තියෙනවා. මේක හැබැයි මම මේ ධර්ම කාරණයත් තියල පොඩි අතිරේකයකුත් මේකට එක්කාසු කළා මේ අද වර්තමානයේ කථා - සාකච්ඡා - ප්‍රවෘති - ලේඛනත් එක්ක ඇදිච්ච එකක්. මම හිතනවා මේකත් පොඩි උදව්වක් උපකාරයක් වෙයි. අපේ පින්වතුනුත් හිතල බලන්ට. ඒක ධර්ම මනසිකාරයට - හිතට හොඳ ඖෂධයක් - පිහිටක් - පූජාවක් වෙයි. තෙරුවන් සරණයි!

බොහොම පිං ස්වාමීන්වහන්ස එතකොට ස්වාමීන්වහන්ස අපි හිතනවා බාහිර ශබ්දයක් ඇහුන කනට - රූපයක් මැවුනා - කොහොමද ඒක උනේ ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - එකම වේලාවේද මහත්තය කියන්නේ? ඔය කියන්නේ රූපයක් මැවෙනවා සද්දයක් ඇහෙනවා කියල එකම වේලාවකද නැත්නම් අවස්ථා දෙහෙකද?

දැන් අපි ඉගෙනගන්න කොට ස්වාමීන්වහන්ස සෝත ප්‍රසාදයට අපිට තරංගයක්නේ එන්නේ සවාමීන්වහන්ස අපි ලෞකිකව හිතනවා එළියේ තියෙන සද්දයක් කනට වදිනවා. වැදුනහම එකපාරටම එළියේ ශබ්ද නැහැ කියල ගැඹුරින් තේරුම්ගන්න අපි උත්සාහ කරනවා. එතකොට අපි දැන් මේ ආපු සද්දය කෙරෙහි අපිට කපුටෙක් කියල එක පාරටම ක්ෂණිකවම එනවා රූපයක් බැලුවොත් ගිහිල්ලා පේනවා. එතකොට ඒක කොහොමද ස්වාමීන් වහන්ස? එක පාරටම රූපයක් මැවුනේ කොහොමද? සුවඳක් එනවා. ඒක වෙන්නේ කොහොමද?

<u>ස්වාමීන්වහන්සේ</u> - මෙහෙම වෙන්නේ මහත්තය. ඉස්සරවෙලා සද්දයක් ඇහුනහම අපේ හිත වේගයි. හරී වේගයි. ඉස්සරවෙලා යනවා පංචද්වාරික සිත් පෙළක් ගිහිල්ලා - එකම පෙළක් නෙමෙයි - පංච ද්වාරික සිත් පේළි පේළි යනවා. නමුත් එක වෙලාවකට පංචද්වාරික සිත් පෙළක් ගිහිල්ලා ඒ සද්දයක් ඉසෙල්ලා ගන්නවා. සද්දයක් අරගෙන ඊට පස්සේ ඒ අලුතෙන් ගත්ත සද්දය සම්බන්ධයෙන් නැවත මනෝමය වශයෙන් සිත් පේළි කීපයක් යනවා. ඉස්සරවෙලා සිද්ද වෙන්නේ සද්දය ඇහෙනකොට ඒ සද්දය ග්‍රහණය කර ගැනීමට පුළුවන් කම ශක්තිය තිබෙන සිත් පෙළක් චිත්ත නියාමයට අනුව ගිහිල්ලා ඒ සද්දය ඇරගෙන - ඒ අහපු සද්දය සම්බන්ධයෙන් නැවත හිතීම් කරන - නැවත මෙනෙහි කිරීම්

කරන සිත් පේළි කීපයක් යනවා. ඒ සිත් පේළි කීපය ගිහිල්ලා ඒ සිත් වලින් තමයි අර තහවරු කරගන්නේ මේ සද්දය. එතකොට දැන් මේ පසුව යන සිත් පේළි කීපය යන්ට, ඉස්සරවෙලාම අලුතින් ආපු සද්දයක් ආශ්‍රය කරගෙන තමයි ඕක සිද්ද වෙන්නේ. එතකොට ඉස්සෙල්ලාම එන සද්දයක් ගත්ත - ඊළඟට හිතින් ගිහිල්ලා අරක තහවරු කරගන්නවා. ඔය ටික සිද්ද වෙන්න අපි මේ මෙච්චර වචන කියන තරම් කාලයක් යන්නේ නෑ. ඕක ටක් ටක් ටක් ගාලා ඉතා වේගයෙන් සිද්දවෙලා ඉවරයි. ඊළඟට කරන්නේ ඒ සද්දය - ඔය සිත් පේළි ටික ගිහිල්ලා ඉවරවෙන කොට හොඳට තහවරු වෙලා - හිතේ කැවිලා - ඇදිල - රැඳිලා යනවා, ඊට පස්සේ නැවත ඒ සද්දය හඳුනා ගත්තට පස්සේ අර පරණ එකක් අරගෙන මේකේ තියල print කරන්න වගේ මනෝද්වාරික වශයෙන් සිත් යනවා. මනෝ ද්වාරික වශයෙන් පරණ එකක් මතක් කරගෙන මේ අහවල් කපුටෙක් - මේ වගේ සද්දයක් තියෙන්නේ කපුටෙකුට කියල ඒක අල්ලගෙන කපුටෙකුගේ සද්දයක් කියල ඒ මතු කරල දෙන්ටත් හඬ හරහා අහල තිබෙන්නාවූ දැකල තිබෙන්නාවූ රූපයකට අනුකූලව ඒ කපුටෙකුගේ පින්තූරයක් මතුකරලා ගන්ට පුළුවන් විදියේ මනෝ ද්වාරික සිත්පෙලක් පස්සේ යනවා. ඒක නිසා අපි අහන වෙලාවෙම අහන දේ එක්කම නෙමෙයි සිද්ද වෙන්නේ තව ටිකක් ඉස්සරහට ගියායෙන් පස්සේ සිද්ද වෙන්නේ මනෝ ද්වාරික සිත් පෙළකින් - මනෝ ද්වාරික චිත්ත වීථි සමූහයකින් - පරණ එකක් මතක් කරලා - එතකොට තමයි මනෝ ද්වාරික ධර්ම සංකල්පනාවක් අපි කපුටෙක් හැටියට දෙයක් හිතා ගන්නේ සහ ඒක මතක් කරලා දෙන්නේ. ඒක නිසා මේකේ තියෙනවා අනුබන්ධන චිත්ත වීථි සමූහයක් තියෙනවා. මනෝද්වාරික චිත්ත වීථි තියෙනවා. ඉස්සෙල්ල ආරම්භ වෙන්නේ පංච ද්වාරික අර කපුටෙක් හැටියට දැකපු හරි නැත්නම් අහපු සද්දයකින්. ඒක නිසා මේ සිත් පේළිය යන්න මහත්තය එකිනෙකට ගැව් ගැව් - ගැව් ගැව් - ළඟ - ළඟ තෙරෙපි තෙරපි - ගැව් ගැව් - මහවිසාල සිත් පේළි කෝටි ගණන් යනවා. ඒකෙ වේගය නිසා අපිට හිතෙන්නේ එක වෙලාවට ඔය ටික සිද්ද වෙනවා කියලා. හරියට කියනවනම් දිය ඇල්ල වගේ.

දිය ඇල්ල කියන එක මහත්තය බලන්න ඔය අභිධර්මය ඉගෙන ගන්නවා වගේම ඔය බාහිර ලෝකේ වස්තු දිහා ටිකක් බලාගෙන ඉඳීමත් හරි පිහිටක් වෙනවා. දැන් දිය ඇල්ලකට ගියන් පස්සේ මෙහෙම එකක් තියෙනවා. මම එක පාරක් බලාගෙන හිටිය මේක කොහොමද වෙන්නේ කියල. ක්‍රම කීපයකටම දිය ඇල්ලක් වැටෙනවා. එක දිය ඇල්ලක් බලාගෙන හිටිය. ඒකෙ හිම කුට්ටි කුට්ටි වගේ හිම ගුලි ගුලි වගේ නිකං එකපාරටම වැටෙනවා. ආයි ඒ අතර තව ටිකක් වැටෙනවා. එතකොට ඒකේ තියෙනවා වතුර කුට්ටි කුට්ටි ගත්තත් නිකං රැලි රැලි - වළාව වගේ එනවා - කාණ්ඩ කාණ්ඩ, එහෙම වතුර වැටෙන එකකුත් තියෙනවා. ඒකටත් කියනවා දිය ඇල්ල කියල. හැබැයි තව එකක් තියෙනවා එහෙම කොටස කොටස එන්නේ නෑ. උඩ ඉඳල පල්ලේහැටම වැටෙනවා සුදු පාටයි. ඒක නිකං ඉරක් ඇන්ද වගේ උඩ ඉඳල. හරියට සුදු පාටයි. හැබැයි ඒකෙ තියෙන්නේ වතුර තනිකර බිංදු බිංදු තියෙන්නේ. වෙන වෙනම හැබැයි ලඟින් ලඟින් ගෑවිලා එන නිසා කිරි ඇල්ල වගේ තමයි පේන්නේ. ඔය එකක්. හැබැයි තවත් එකක් තියෙනවා. දවසක් මට මතක් වෙනවා අපි පොඩි කාලේ දිය පීල්ලක් තිබුන. ඒ දිය පීල්ල ගලකින් පල්ලෙහාට වැටෙනවා. හැබැයි වතුර හරියට පුළුල්ව රෙද්දක්

වගේ පහළට වැටෙනවා. ඒ වැටෙන එක සුදු පාටට නෙමෙයි වැටෙන්නේ හරියට කණ්ණාඩියක් වගේ. හැබැයි ඒ කණ්ණාඩිය වගේ වැටෙන කොට වතුර අතරෙන් අර පීල්ලේ බිත්තිය බලන්න පුළුවන්. ඒකත් දිය පීල්ලක්. හැබැයි ඒක මැදින් කෝටුවක් ගැහුවයින් පස්සේ වතුර කැඩෙනවා. හේතුව වතුර බිංදු බිංදු එකට ගැවුනයින් පස්සේ කණ්ණාඩිය වගේ හැදෙනවනේ. දැන් බලන්න වතුර පීල්ලක - ඕක tap එකෙකිනුත් බලන්ට පුළුවන් - එකට ගැව්ලා වීදුරුව වගේ වෙන එකක් තියෙනවා. කාණ්ඩ කාණ්ඩ වගේ නිකං press වෙලා කැඩිලා කැඩිලා එන ඒවත් තියෙනවා. එකට කිරිවගේ දියට එන එකකුත් තියෙනවා. හැබැයි හැම තැනම තියෙන්නේ පොඩි පොඩි - පොඩි පොඩි වතුර බිංදුවලටත් වඩා පොඩි ඒවා. ඒවගේ, සිත ගත්තයින් පස්සේ ඔය සිතේ චිත්තක්ෂණ රාශි එකතුවෙලා හරි වේගෙන් යනවා. ඒ වේගය වැඩි කම හින්ද අපිට පේනෙන්නේ අපිට දැනෙන්නේ අර ඔක්කොම එක තැනක සිද්ද වෙනවා කියලා. ඒක නිසා මේකේ වේගයත් අපි ඔය විදියට තේරුම් ගන්න ඕනෑ. එක වෙලාවක වෙන්නේ නැහැ මහත්තය ඒක මනෝ ද්වාරික චිත්ත වීථි වශයෙන් තමයි අර සත්තුන්ගේ පින්තූර දැනෙන්නේ. තෙරුවන් සරණයි!

හොඳයි ස්වාමීන්වහන්ස බොහෝම පිං. අනේකවාරයක් පිං. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - එතකොට අපිට තෙරුම් ගන්න පුළුවන් - ගොඩක් අය හිතනවා මෙතන මතක් ගබඩාවක් තියෙනවා කියල. එතැන තියෙන්නේ සංඥා එක්කාසු වීමකින් පරණ සංඥාවක් තුලින් අපි තේරුම් ගැනීමක් නේද ස්වාමීන්වහන්ස. එතකොට අපිට ඒකම විදර්ශනාවට හරවා ගන්නත් පුළුවන් සංසාරයේ මේ අවිද්‍යාව ඇතිවෙන්නෙත් ඒ වගේ සංඥා වලට අපි රැවටීම තුලින් කියල. නේද සවාමීන්වහන්ස.

<u>ස්වාමීන් වහන්ස</u> - එහෙමත් පුළුවන්. අවිද්‍යාවත් තියෙනවා. ඒ සියල්ලම රාමු -කාල - චිත්තක්ෂණ - ඒවාගේ තිබෙන්නාවූ නොදැනුවත් කම, ඒකත් අවිද්‍යාව. ඊළඟට තව එකක් ඉතින් ඔය සංඥා වශයෙන් ක්‍රියාත්මක වෙන දේවල්. ඒවත් තිබෙනවා. මතක කියල ගොඩගහ ගත්තු දෙයක් ඇත්ත වශයෙන්ම නැත්තෙත් නෑ ඇත්තෙත් නෑ. අන්න එහෙම එකක් තමයි කියන්න පුළුවන් කම තියෙන්නේ. ඇත්තේ නෑ කියල කියන්නේ ඉතින් තියනවානම් මතු කරලා ගන්න පුළුවන් කම තියෙන්න එපාය. නැතෙයි කියල කියන්නත් බැරි යමක් මතක් කරනකොට ඉතින් ආරම්මණය එනවනේ කඩාගෙන. ඒක නිසා. ඉතින් විදර්ශනා කරන්නත් ඒක හේතුවෙනවා මහත්තයා. ඉතින් ධර්මය පැත්තෙන් බලන බැලීම් නම් තුන් හතර පැත්තක් තියෙනවා. ඉතින් අපි මේක හරහා බලන්නේ මහා පොඩි සියුම් තැන්. හරියට සුදුපාටට ඇනිච්ච කට්ටක් - පොඩී - හරි සියුම් - ඔය තියෙන්නේ විදුරු කෑලි හරියට පේන්නෙත් නෑ - අන්න ඒ වගේ පොඩි ඒවා - කොහොමද මේක මේ වෙන්නේ කියන තැන් බලන්න තමයි යන්නේ. හොඳයි තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි අප්‍රමාණ පිං ස්වාමීන් වහන්ස.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ඒ නිරෝධ සමපත්තියට සැම වැදුන යෝගවචරයාට හුස්ම රැල්ල වැටෙනවද ස්වාමීන් වහන්ස.

<u>පිළිතුර</u> - නෑ මහත්තය හුස්ම රැල්ල වැටෙන්නේ නෑ. හුස්ම රැල්ල වැටෙන්නේ නැති තැන් තියෙනවා. මිනිස්සු මැරෙන්නෙත් නැති හුස්මත් නැති තැන් තියෙනවා කීපයක්. එකක් තමයි ඔය වතුරේ ගිලුනයින් පස්සේ මිනිස්සු හුස්ම ගන්නේ නෑ නමුත් ටික වේලාවක් යනකම් පණ තියෙනවා. හුස්ම ගන්නේ නෑ. ගොඩට ගෙනාවට පස්සෙත් එහෙන් මෙහෙන් ගස්සල හොල්ලල පෙරලලා ගත්තයින් පස්සේ ආයේ පණ එනවා එනවා කියල කියන්නේ මැරිච්ච එකක් නෙමෙයි නමුත් ඉතින් නැවත hart beat වැඩ කරනවා. ඊළඟට අනිත් එක තමයි හතර වෙනි ධ්‍යානයට ගියායින් පස්සෙත් හුස්ම රැල්ල නවතිනවා. එහෙමත් වෙනවා. සමහර වෙලාවට බොහෝම කලාතුරකින් සමහර මිනුස්සු භය වෙනවා. භය වෙච්ච ගමනුත් ඕක ටක් ගාල නවතින්වා හැබැයි ටික වේලාවක් ඊට පස්සේ තියෙනවා. ඊළඟට නිරෝධ සමාපත්තියේදී කොහොමත්ම හුස්ම රැල්ල නෑ මහත්තයා.

සාධූ සාධූ අප්‍රමාණ පිං ස්වාමීන්වහන්ස.

ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි! ඔබවහන්සේට අලුත් කොටසකට යන්න වෙලාව ප්‍රමාණවත් වෙයිද කියන එකේ ප්‍රශ්නයක් තියෙනවා. ඔබවහන්සේ කොහොමද හිතන්නේ ඒගැන?

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒකත් හැබැයි මහත්තය හොඳයි. අලුත් කොටසක් තියෙනවා - මේ නිස්සය ප්‍රත්‍යයයේම තියෙනවා කොටස් දෙකක්. මේ ටික මම හොයල බැලුවේ එකක් 'සහජාත නිශ්‍රය ස්වභාවයයි' 'පුරේජාත නිශ්‍රය ස්වභාවයයි' ඒ දෙක පිළිබඳව තමයි ප්‍රශ්න ඇහුවේ සහ කියල දුන්නෙත් හැබැයි ඒකෙ තියෙනවා තව කොටසක් මහත්තය පුරේජාත එකේ තව විස්තරයක් තියෙනව අපි දැන ගත යුතුයි ඒක. ඒකට හැබැයි මේ වෙලාවේ ටිකක් කියල දෙන්ටත් කාලේ නැතිත් වගේ තියෙනවා.

එකක් තමයි - දැන් පුරේජාත ප්‍රත්‍යය කියන එක තේරෙනවනේ. පුරේජාත ප්‍රත්‍යය කියල කියන්නේ පළමුවෙන් ඉපදිලා පසුව උපදින දේකට ප්‍රත්‍යය වීම කියන එක. පළමුවෙන් ඉපදී පසුව හට ගන්නාවූ දේකට ප්‍රත්‍යය වෙන ස්වභාවය තමයි 'පුරේජාත ප්‍රත්‍යය' කියල කියන්නේ. ඒක අපි ලොකු ලොකු දේවල් ආධාර කරගෙන ඔන්න අපි කථා කරනවා. හැබැයි ඒ 'පුරේජාත ප්‍රත්‍යය' ටිකක් විස්තර වෙනවා මෙහෙම. එකක් තමයි 'නිශ්‍රය ධර්‍ම' 'පුරේජාත වෙනවා'. ඒකට කියනවා **'වස්තු පුරේජාතය'** කියල. ඒකත් නිශ්‍රය ප්‍රත්‍යයක්. අනිත් එක තමයි **'වස්තු ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය'**. ඒකත් නිශ්‍රය ප්‍රත්‍යයක්. කරුණු දෙකක් කිව්වා. පටලවා ගන්න එපා. එකක් තමයි **'වස්තු පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'** – **'වස්තු ආරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යය'** කියල. ඔය පුරේජාත ප්‍රත්‍යය කොටස් දෙකක් වෙනවා. ඒක පිළිබඳව ටිකක් ගැඹුරකුත් වගේ තියෙනවා - ඒක වෙන්නේ කොහොමද කියල. ඒක හින්ද අපි මේක තව ඉස්සරහට තියමු. එතකොට කාලයක් අරගෙන කියල දෙන්න පුළුවන්. එහෙම වෙයි නේද මහත්තය?

දළුවත්ත මහතා - එහෙම හොඳයි ස්වාමීන්වහන්ස මටත් හිතෙන්නේ එහෙම හොඳයි අපේ හාමුදුරුවනේ. ඒ කොටසට විස්තරාත්මකව යන හොඳයි කියල.

<u>ස්වාමීන් වහන්සේ</u> - මාතෘකාව විතරක් නම් යොදල දුන්නා. නමුත් ඒක ටිකක් අතපත ගහන්න ඕනෑ කොහොමද මේක වෙන්නේ කියල. නැත්නම් එහෙම අවබෝධය හරියට යන්නේ නෑ. අපි පොත ඉවර කරන්නේ නෙමෙයිනේ මේක  කරන්නේ. ධර්මය අවබෝධ කරගන්ටනේ.

එහෙමයි ස්වාමීන්වහන්ස දැන් අපි කථාකරපු සහජාත නිශ්‍රය ප්‍රත්‍යයයත් පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයයත් යන  කාරණාව සවාමීන් වහන්ස කිසියම් කෙනෙකුට සමුදය අත්ථංගමය දකින්න දුක්ඛය අවබෝධ කරගන්න නැත්නම් ස්කන්ධයන් විභාග කරන කෙනෙකුට විදර්ශනාවකට ගන්න අවස්ථාවකදී එහෙම මොන විදියකටද උපකාර වෙන්නේ කියන එකටත් ස්වාමීන් වහන්ස අපිට කිසියම් ඉඟියක් ලබා දෙන්න පුළුවන්ද ස්වාමීන්වහන්ස. මොකද මම එහෙම කියන්නේ ස්වාමීන්වහන්ස ඊයේ සාකච්ඡාවේදී ඒ වගේ කොටසකට පොඩ්ඩක් යොමු උනා. මොකද අපේ සාකච්ඡා මණ්ඩපයේ ඉන්නවා අපේ හාමුදුරුවනේ  අභිධර්මයට වැඩි අවධානයක් නැහැ නමුත් සම්බන්ධ වෙලා එකතුවෙලාත් ඉන්නවා. නමුත් සූත්‍ර භාවිතයෙන්ම කටයුතු කරන අයත් ඉන්නවා. ඉතින් ඒ අයටත් දැන ගන්න ස්වාමීන්වහන්ස කොහොමද මේ කාරණාවල් කිසියම් දුරකට හෝ  අපි යොදා ගන්නේ භාවනාවකදී කියල.

<u>ස්වාමීන්වහන්සේ </u>- භාවනාවකට යොදා ගැනීමට ඉතාමත්ම හොඳ තැන තමයි ‘සහජාත නිශ්‍රයට’ වඩා ‘පුරේජාත නිශ්‍රය’ සාමාන්‍යයෙන් ලොකුවට අහුවෙනවා. ‘සහජාත නිශ්‍රය’ හසුකරගන්ට කෙනෙකුට ටිකක් අමාරුයි. නමුත් ‘පුරේජාත නිශ්‍රය’ කියන එක භාවනාවෙහි යොදාගන්ට ලේසි කමක් තියෙනවා. දැන් අපේ ඇස - කන -  නාසය - මේ ශරීරය - දැන් අපි හිතල බැලුවයින් පස්සේ නිශ්‍රය කියල කියන්නේ ඉස්සෙල්ල පහළ වෙලා පසුව හැදෙන්නාවූ සිත්වලට වද දෙන්ට හරි ඇතිවෙච්ච  උපකාරක ධර්ම ස්වභාවයක්නේ. දැන් හිතන්ටකෝ මේ කොණ්ඩය මිනිස්සු පීරනවනේ. ඒ කොණ්ඩෙ  පීරන්නේ එදා උදේ හැදිච්ච කොණ්ඩයක් නෙමෙයිනේ.  ඊයේ හෝදලා පීරලා තිබිච්ච කොණ්ඩෙනෙ මේ අද අමුතු විදියට පීරන්නේ - හදන්නේ. එතකොට දැන් ඔය සමහර අය යනවනේ hair dressing වලට යනවනේ. එහෙම යනකොට hair dressing එකෙන් ගත්ත කොණ්ඩයක් නෙමෙයිනේ පීරන්නේ. මෙහෙන් අරගෙන ගිහිල්ලා ඊට පස්සේ art work එකක් දානවා කියල කියනවා. ඔය කට්ටිය කියනවා කොණ්ඩය කපන්න යන ගානයි ඊට පස්සේ ඔය dressing වලට යන ගණන් ඕව ලොකු ගණන්. ඉතින් ඒවා කියනවා. ලස්සනට හදාගෙන කියාගෙන පීරාගෙන කපාගෙන කොටාගෙන එනවා. දැන් බලන්ට බාබර් සාප්පුවේ වැඩ කරන මනුස්සයට සිත් පහළ වෙනවනේ අලුතින් ආපු එක්කෙනාට මේ කලාව දෙන්ට ඕනෑ කියල. ඒ කොණ්ඩය අයිතිකාරයට හිතෙනවා මම අහවල් බාබර් සාප්පුවට යන්න ඕනෑ අහවල් hair dressing එකට යන්න ඕනෑ කියල. ඊට පස්සේ එයාට ලෝභ කමක් ඇතිවෙනවා කුමක් සම්බන්ධයෙන්ද - ඉස්සෙල්ල පහළවෙලා තියෙන්නාවූ කොණ්ඩය සම්බන්ධයෙන් - මේ විදියට හැඩක් - මේ විදියට ආකාරයක් - මේ විදියට රටාවක් - පීරීමක් - හැඩ කිරීමක්  - එන්ට ඕනෑය කියල. එතකොට එයාට ලෝභය හිතෙන්නේ අර ඉස්සෙල්ල හටගත්ත කොණ්ඩයටනේ. එහෙමත් තියෙනවා.

ඊළඟට බාහිර වශයෙන් වස්තුවක් ගත්තොත් එහෙම මිනිස්සු පොල් වතුවලට - රබර්වතු වලට - ඉඩකඩම් වලට - ගෙවල් දොරවල් වලට නඩු හබ කියනවා. සණ්ඩු සරුවල් වෙනවා ව්‍යාපාදය ඇතිවෙනවා ඊර්ෂ්‍යාව හැදෙනවා ඒ ඔක්කෝම පස්සේ හැදෙන්නාවූ ඊර්ෂ්‍යාවල් තරහ වෛර ක්‍රෝධ බැනගැනීම් සියල්ලම අකුසල් වශයෙන් ඇතිවීමට ඉස්සෙල්ල ඇති උන වස්තුව හේතු උනානේද කියල ඒ විදියට මෙනෙහි කරන්ට පුලුවන් මේ ධර්‍මයට. විශේෂයෙන්ම - පසුව ඇතිවෙන නාම ධර්‍ම වලට තමයි කියන්නේ.

තවත් තිබෙනවා, දැන් මේ ඉස්සරවෙලා කරලා තියෙන්නාවූ කර්මයක විපාකයක් හැටියට මේ වගේ ඇඟක් මේ වගේ ශරීරයක් හදල දුන්නා. මේ ශරීරයෙන් - මේ කටින් - මේ කනෙන් - මේ නාසයෙන් - යම් යම් දේවල් අහන්න කියන්න සිද්ධ වෙනවා. ඒ එක්කම ඊට පස්සේ අලුතෙන් අලුතෙන් ඒ දේවල් සම්බන්ධයෙන් හිත් පහළ වෙනවා. ඒ අලුතෙන් හිත්පහළ වෙන්ට කේන්ද්‍රය වෙන්නේ - නිශ්‍රය වෙන්නේ - භූමිය වෙන්නේ මේ ශරීරය නේද - මේ ඇස් නේද - කන් නේද -ශරීරය නේද කියල මෙනෙහි කරන්න පුළුවන් වෙනවා. අනිත් එක තමයි ඔය සමහර වෙලාවට කියනවනේ 'මේ වගේ දුකක් විඳින්ට මට ලැබුනේ මේ ජීවිතයේ මේ දේ ලැබිච්ච හින්දනේ, නැත්නම් මම කිසිම දුකක් විඳින්නේ නැහැ' කියල. එතකොට ඒකෙන් පේනවනේ ඉසරවෙලා ලැබිච්ච දෙයක් හින්ද පස්සේ මේවගේ විඳවන්ට සිද්ද උනාකියල. ඒක නිසා අන්න ඒ විදියට අනිත්‍ය මෙනෙහි කරනවා වගේම ඒක බලපාපු ආකාරය නිශ්‍රය ප්‍රත්‍යයට දාල නුවණින් පරික්ෂා කරන්ට පුළුවන්. ගොඩක් ඔය පුරේජාත ප්‍රත්‍යයට බලපානවා. ගොඩක් ලඟට ලඟට කිට්ටු වෙන්ට වෙන්ට සහජාත ස්වභාවයට හසුරුවන්න පුළුවන් කම තියෙන්නේ පරම්පරා වශයෙන් සන්තතියක් වශයෙන්. ඔය විදියට තමයි ඒකෙ බලන්ට වෙන්නේ හැබැයි තව එකක් තියෙනවා මෙන්න මෙහෙම.

මේ පට්ඨානය ධර්‍මය ගැන කියන කොට මේකේ අමුතු ගුණ විශේෂයක් තමයි සලකන්නේ. ඒක කියනවානම් කාන්දන් කැල්ලක් මොකක් හරි තවත් වස්තුවකට කිට්ටු කරනවා. කිට්ටු කරහම ඒ කාන්දම් කැල්ලේ තියෙනවා වස්තු වශයෙන් ඇතිවෙලා නැතිවෙලා ගෙවිලා යන්නාවූ සවභාවය. ඊළඟට ඒ කාන්දන් කැල්ලට අදින වස්තුවක් තිබෙනවා නම් ඒකෙත් තියෙනවා ඇතිවෙලා නැතිවෙලා යන ස්වභාවය. ඊළඟට ඒ කාන්දම් කැල්ල සහ වස්තුව යන දෙකේ අතර තියෙනවා අර වස්තුව මේ වස්තුවට ග්‍රහණය කරන අද්දන ගතියක්. ඒක බලපෑම් ස්වභාවයක්. ඒකෙ තියෙන තවත් සියුම්වූ ශක්ති ගුණ ස්වභාවයක්. ආන්න ඒවා තමයි පට්ඨාන ධර්‍මයේ කථා කරන විශේෂිත තැන්. ඒක නිසා මේවා විදර්ශනා කරන්නත් පුළුවන් - සමහර තැන් වලදී මේ ශක්තිත් මේවත් එක්ක හැංගිලා නැතිවෙලා යනවා කියන එක බලන්න පුළුවන්. තවත් මොනවා හරි තියෙනවා නම් පස්සේ අහන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - අවසරයි ස්වාමීන් වහන්ස විපාක ධර්‍මයෝ ඔය ආකාරයට හිතන්න සුදුසුද හාමුදුරුවනේ එහෙම හිතන්න පුළුවන්ද?

<u>පිළිතුර</u> - පුළුවන්, මහත්තයට මතක ඇති අපි ධර්ම කොට්ඨාසයක් ගැන කථා කළා. මේ පට්ඨානයේ ඇත්ත වශයෙන්ම කියාගෙන යන්නේ අවසානය නෙමෙයි. මේක මේ යන්තම් අඩිය ගැහුවා විතරයි. මේකේ තව තියෙනවා ඉස්සරහට දිග හැරෙන මහා ගොඩක් තියෙනවා. ඒකට යන්නත් එක්ක පුලුවන්ද කියල බලන්නත් එක්ක තමයි මේ ප්‍රශ්න අහ අහ බල බල යන්නේ. විපාක ධර්ම ගැන අපි කිව්වා මහත්තයා. ඒක කියන්නේ මෙහෙමයි - **'විපාකා ධම්මා'** – **'විපාකධම්මධම්මා'** - **'නෙවවිපාකනවිපාකධම්මධම්මා'** කියල අර තික මතිකාවේ තැනක අපි කථාකළා. එතනින් කියන්නේ, ඒක විදර්ශනා කරන්න පුළුවන් විදර්ශනාවෙන් දැක ගන්න පුළුවන්. **'විපාකා ධම්මා'** කියන්නේ විපාක හැටියට ක්‍රියාත්මක වෙන නාම ධර්ම කොට්ඨාසයක් තියෙනවා. ඒවගේම විපාක හැටියට හැදිලා තිබෙන රූප ධර්මත් තිබෙනවා. විශේෂයෙන්ම නාම ධර්ම. එතන ගන්නේ අර තියෙනවනේ අහේතුක සිත් - ඒවා විපාක ධර්මනෙ. චක්ඛු විඤ්ඤාණ - සෝත විඤ්ඤාණ ආදිය ඕවා විපාක ධර්මනෙ. ඊළඟට ඔය සන්තීරණ සිත ඊළඟට සම්පටිච්ඡන සිත් විපාක ධර්ම. අනිත් එක තමයි මහා කුසල් වල තිබෙනවා විපාක සිත් ටිකක් - අරූපා වචර සිත් තියෙනවා විපාක වශයෙන්. මේවා ඇවිල්ල නාම ධර්ම හැටියට වෙන තැනක ඇතිවෙච්ච ධර්ම - විපාක හැටියට ඉලිප්පිලා එන එකක්. ඒවා ඔක්කොම හඳුනා ගන්නවා - මේක විපාක ධර්මයක් - මේක විපාක ධර්මයක්ය කියල. තව එකක් තමයි මේ සමහර අවස්ථාවලදී - දවසක් මම ඉවසීම ගැන - තරහව ගැන බණ දේශනාවක් කරා. තරහ කොහොමද ඇතිවෙන්නේ - කොහොමද දැනෙන්නේ ඊට පස්සේ ඒ තරහව handle කරන්නේ කොහොමද කියල. ධර්ම මණ්ඩපයේ හිටපු අය හොඳට අහගෙන ගියා. මහත්තයෙක් ඊට සති දෙහෙකට විතර පස්සේ ඇවිල්ල මට කියනවා 'බණත් මම දන්නවා - අහලත් තිබෙනවා - පොතුත් කියවල තිබෙනවා' - මටත් පින්දුන්නා ඒ කියපු කාරණා ටිකට - 'ස්වාමීන් වහන්සේටත් පිං සිද්ධ වෙනවා තරහව මැඩ ගන්න ආකාරය කිව්වට - හැබැයි ඒක හිතෙන් යන්නේ නෑ' කිව්වා. තරහක් හිතට ආවයින් පස්සේ ඒ කියන්නේ තරහ කියන එක ආවට පස්සේ හිතින් විඳවන ගතියක් තියෙනවා. ඒ විඳවන ගතිය හිත තෙරප තෙරප - තෙරප තෙරප - ශරීරය තෙරප තෙරප පීඩා කර කර - දව දවා - දව දවා - රස්නේ කර කර - උණුහුම් කර කර පීඩාකරමින් ඒක පවතිනවා - ඒක මෙනෙහි කරනවා - ඒක මෙනෙහි කරන කොට, හොඳට තියෙනවා කියලත් ජේනවා. ඊළඟට ඒ තරහව කියල හොඳට හඳුනා ගන්න පුළුවන් ශක්තියකුත් තියෙනවා. ඒ උනාට ඒක සංසිඳිල යන්නේ නෑ. දවස් ගණන් සති ගණන් උදේට ටිකයි දවාලේ ටිකයි හැන්දෑවේ ටිකයි ඕක කැකෑරි කැකෑරි ඕක ඔහේම තියෙනවා. ඉතින් ඒක අමුතුම ගතියක්. ඉතින් ඒක මොකක්දැයි කියල ඇහුවා. ඇත්ත වශයෙන්ම බැලුවයින් පස්සේ විපාක එන්නේ ඔය විදියටයි. වතුර එකක් උණු කරන කොට ගින්දර දාන්න දාන්න boil වෙනවනේ. රස්නේ තියෙනවනේ. ඒවගේම රත් වෙච්ච එක ඔය උණුවතුර බෝතලේකට දැම්මයින් පස්සේ උණුවතුර බෝතලේට ගින්දර දාන්නේ නෑ. ඒ උනාට උණුවතුර බෝතලේ අර ඉස්සෙල්ල රත් වෙච්ච එකේ විපාකයක් හැටියට ඒක ඔහේ තියෙනවා. උණුවතුර බෝතලේ රස්නේ පවතිනවා. අන්න ඒ වගේ අපේ විපාක ධර්ම ගැන හිතනකොට ඒ විපාක ධර්මත් එක්ක නාම ධර්මයොත් ගැට ගැහිලා එනවා. ඒ නාම ධර්මයෝ - ඒ තෙරපීමට - ඒ පිළිකුල් කිරීමට - ඒ වෛරයට - තරහවට අප්පිරිය කර කර ඔහේ ඉන්නවා. ඒක හිතින් යන්නේ නෑ. ඕවා විපාක ධර්ම හැටියට විදර්ශනා වශයෙන් අල්ලන්න පුළුවන්. ඒක ඒ විදියටම හොඳට බලාගෙන ඉන්න පුළුවන් හැබැයි සමහර දවස් තියෙනවා

අයින් වෙලා යන්නේ නෑ. ඔහේ කැකෑරි කැකෑරි පල් වෙවී විඳව විඳව තියෙනවා. අකමැති එක වෙනම එකක්. යන්නේ නැතිඑක වෙන එකක්. ඔය විදියට බලන්න පුළුවන් මහත්තය. ඒක යම් කිසි උපකාරයක් උනාද කියල කිව්වොත් ඒකත් පිහිටක් හැම එක්කෙනාටම.

තේරුනා හාමුදුරුවනේ බොහොම පිං තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි හැමදෙනාටම අවසරයි ස්වාමීන්වහන්ස! අද සාකච්ඡාවේදී ඔබවහන්සේ කියපු කරුණු වැටහුනා. ප්‍රශ්නයක් වශයෙන් කියල නම් ඔළුවට ආවේ දැන් සමහර වෙලාවට භාවනාවේදී දකින දෙයක් තමයි ස්වාමීන්වහන්ස දැන් යම් යම් දේවල් අපි ඇතිවෙන විදිය බලනවා. ඒවගේම මේක ඇතිවෙලා කියල දැනගන්න බව - එතකොට මම දැකල තියෙනවා ටිකක් වැඩිපුර වේලාවක් බලනකොට ඒ කියන්නේ හුස්ම රැල්ලක් වෙන්න පුළුවන් වෙන ඕනෑම දෙයක් - වේදනාවක් උනත් - සිතිවිල්ලක් උනත් - ඇතිවෙන එකයි - ඒක ඇතිවෙන බව දැන ගන්න එකයි එකටම වෙනවද කියල හිතෙනවා. ඒවගේම තමයි අර දැන ගන්න එකට බලපෑමක් නෑ කියලත් හිතෙනවා. දැන් ස්වාමීන්වහන්ස මේ සහජාත ප්‍රත්‍යය කියන එක, එක සැරේටම මේක ඇතිවෙන ගමන්ම අනිත් ඒක ඇතිවෙන්න උපකාරී වෙන ධර්මයක් හැටියට ස්වාමීන්වහන්ස දැන් යමක් හට ගැනීමත් ඒ හට ගන්න බව දැන ගැනීමත් එකට සිද්ධ වෙනකොට දැන් මේ දෙක අතර සම්බන්ධයක් තියෙනවද එතකොට ස්වාමීන් වහන්ස මේක මගේ අත්දැකීමක. මට දැන ගන්න ඕනේ ස්වාමීන්වහන්සේ මේ වගේ ප්‍රත්‍යය ධර්ම තියෙනකොට එහෙම විස්තර කරලා තියෙනවාද මේ මේ අදාල දේවල් තමයි මෙන්න මේ විදියට සහජාත ප්‍රත්‍යය වෙන්නේ මේවා සහජාත ප්‍රත්‍යය නොවෙයි ආදී වශයෙන් සඳහන් කරලා තියෙනවාද ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - සහජාත ප්‍රත්‍යය ධර්මයන්ගේ සඳහන් කරලා තියෙනවා. අපි ගියපාර කිව්වා - ස්කන්ධ ධර්මයෝ මේ විදියට වෙනවා කියලා. අපි සහජාත ධර්මයෝ නම් කරලා - ඒ ධර්ම වෙන වෙනම - වෙන වෙනම - එකට වෙන තැන් තියෙනවා - රූප ධර්ම වෙනම - නාම ධර්ම වෙනම තියෙනවා. සමහර අවස්ථාවල පොඩ්ඩක් ඒ දෙගොල්ලෝ එක්කාසු වෙන තැන් තියෙනවා. ඒවා දක්වලා තියෙනවා. අනිත් එක තමයි මහත්තයා අපි හිතුවට ඔය ධර්ම මත ඇතිවෙන ධර්මය පේනවා - නැතිවෙන ස්වභවය පේනවා - ධර්මයක් ඇතිවෙනවා - ඇතිවෙන කොටම පේනවා - ධර්මයක් නැතිවෙනවා - මැරී යනකොටම පේනවා - ඒ එක්කම බලනවා කියල - අපි එහෙම කිව්වට මහත්තය ඔය ඔක්කොම එක වෙලාවට පේන්නේ නෑ. වේගය වැඩි කම හින්දාවෙන් - දැන් අපි හිතමු උදාහරණයක් හැටියට විනාඩියක් භාවනා කරනවා කියල. විනාඩියක් භාවනා කරන කොට ඒ විනාඩියේ අපි යම්කිසි ධර්ම ටිකක් දැකලත් තියෙනවා හැබැයි නොදැකපු ඒවත් ඔය අස්සේ තියෙනවා - ඒක නොදැක්කයි කියල තේරෙන්නෙත් නෑ. ඒක නිසා විදර්ශනා කරනකොට පට්ඨානයේ හැටියට එච්චර සියුම්ව බලන්ට අවශ්‍ය නෑ. පට්ඨානය ඉගෙන ගන්න පුළුවන්. පට්ඨානය තේරෙන වෙලාවට ඒකෙ කොටස් තේරේවි. බුදුරජාණන්වහන්සේගේ ඥානයේ තිබෙන්නාවූ විසිතුරු කමත් එක්ක ධර්මයේ තිබෙන අනිත්‍ය නිස්සාර ස්වභාවයත් එක්ක ඒවා ක්‍රියාත්මක වෙන දේවල් දැන ගැනීම සඳහා උපකාර වෙන ධර්මයක් හැටියට මේව ඉගෙන ගත්තට කමකුත් නෑ. ඒ

බුදුරජාණන්වහන්සේලාගේ නුවණට තරම් අපිට එහෙම අහුවෙන්නෙත් නෑ. නමුත් මේවා උපකාර නොවී තියෙන්නෙත් නෑ. අනිවාර්යෙන්ම මේවගේ මනසිකාරයට උපකාර වෙනවා. විදර්ශනාවට උපකාර වෙනවා යම් තැනකදී. අර ඉස්සර කාලේ ස්වාමීන්වහන්සේලාත් භාවනා කරලා තිබෙනවා මේ පට්ඨාන ධම් අහල ඊට පස්සේ දියේ යද්දී එහෙම, හැබැයි අපි භාවනා කරන්න ගියහම, මේවා මුකුත් හිතන්නේ නැතුව එන එන - එන එන දේවල් මෙනෙහි කරගෙන සිහිය පවත්වාගෙන යනකොට අහුවෙන ඒවා අහුවේවි අතහැරෙන ඒවා අතහැරේවි. මතක් වෙන ඒවා මතක් වෙවී - පෙනෙන ටික පෙනේවි - අනිත් ඒවා ගැන මුකුත් 'මේවා කරන්ට ඕන - මේ ආපු දේ අනිවාර්යෙන්ම අහන්ට ඕන නේද' කියල ඒ තර්ක දාන්නත් අවශ්‍ය නෑ. මේ කියල දෙන ඒවා යම් යම් අවස්ථාවලදී ඕන ඕන වෙලාවට ඔක්කොම නෙමෙයි ඒකෙන් කීප දෙයක් හරි මතුවෙලා ඒවි, එතකොට යම් යම් කොටසක් වැටහේවි. හැබැයි අපි උනත් භාවනා කරන්ට යනකොට මේ මොන දේ කිව්වත් - 'මේ ටික කිව්වා - මේ ටික තේරෙනවා - මේ ටික මෙහෙමයි' කියල හොය හොයා -හොය හොයා යන්නේ නෑ. සිහිය පවත්වාගෙන නුවණ පවත්වාගෙන ඉන්නවා. පෙනෙන ටික පේනවා නැතිටික නෑ - නැති ඒවා කියල දුක් වෙන්නෙත් නෑ. තව එකක් කියන්න ඕන. අපිට ඔය පෙනුනට ඕක ඕලාරික මට්ටමෙන් සිද්ධ වෙන්නේ. ඒ කියන්නේ ලොකු මට්ටමෙන්. සියුම් මට්ටමෙන් ඇතිවෙන නැතිවෙන එක - ඒක එහෙම වැටහෙන්නේ නෑ. සන්තති වශයෙන් - ඒවගේම ඝන ස්වභාව වශයෙන් - රංචු රංචු තමයි ඕක සිද්ධ වෙන්නේ. ඒක නිසා මේ සියුම් ස්වභාවයට, පස්සේ මොකක් හරි වේවි. දැන් දැනෙන හැටියට කරගෙන යන එක තමයි හොඳ කියල මම බොහොම මෛත්‍රීයෙන් මතක් කරනවා.

බොහොම පිං ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! අවසරයි ස්වාමීන්වහන්ස මම මේක තේරුම් කරගන්න අහන්නම් සමහර වෙලාවට මම වැරදි වෙන්න පුළුවන්. ස්වාමීන්වහන්ස අර මුලින්ම අහපු ප්‍රශ්නත් එක්ක අර ජයන්ත මහත්මය අහපු පටිසම්භිදාමාර්ගයෙහි 'පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා' කියන ඒ විස්තරෙත් එක්ක මේ අභිධර්මය ගලපන්න යනකොට මම හිතනවා ස්වාමීන්වහන්ස පොඩි පැටලවිලි සහගත තත්වයක් හැටියට තිබෙයි කියල වගේ. සමහර වෙලාවට මම වැරදි වෙන්න පුළුවන්. දැන් ඒ කියන එකත් එක්ක ගලපන්න ගියොත් සමහර වෙලාවට, විග්‍රහ වලදී ඇහෙනවා ඔය ප්‍රසාද රූප ගත්තහම සෝත ප්‍රසාදය සෝත විඤ්ඤාණය හටගන්නා අවස්ථාවෙදි සෝත ප්‍රසාදය අර පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතිව නිරුද්ධ වෙනවා කියල විග්‍රහ වෙනවා. එතකොට ඒකෙන් අදහස්වෙනවා ඒවෙලාවේ අනිත් ප්‍රසාද ටික නැහැයි කියල වගේ. ඒ උනාට ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපිට කියල දීපු විදියට - මම තේරුම් අරගෙන තියෙන විදියට - ප්‍රසාද ටික ඒ විදියට ගලපන එක මට හිතෙනවා වැරදියි කියල. හැම ප්‍රසාදයක්ම අපි රූප විදියටමනේ ගණන් ගන්නේ. එතකොට ඒ රූප 28 නෙ අයිතිවෙන්නේ. ඒ ප්‍රසාද හැම මොහෙතේම රූපයේ ආයුෂත් එක්ක බිඳි බිඳී ගියාට කෙනෙක් ඉපදිච්ච මොහෙතේ ඉඳන් මැරෙණ මොහොත වෙනකම් ඒ ප්‍රසාදය පැවති පැවති යනවනේ. ඒකහින්ද එක මොහොතක එක දෙයක් නිසා ඇතිවෙන්නේ එක ප්‍රසාදයක් උනාට අනිත් ප්‍රසාද ඒ වෙලාවේ නැහැයි කියන්න

බැනේ. ඒවත් චිත්තක්‍ෂණ 17 ක ආයු කාලයක් සහිතව ජීවිත කාලය තුල පවතිනවා නේද ස්වාමීන් වහන්ස? පැහැදිලිද දන්නේ නෑ මම කියපු එක ස්වාමීන්වහන්ස.

පිළිතුර - මට පැහැදිලියි මහත්තය කියාපු එක හරි. මුකුත් කියන්න විස්තර කරන්න මට අවශ්‍ය නෑ. මහත්තය කියපු එක හරි. ඔය දෙක පටලව ගන්න හොඳ නෑ. සූත්‍ර දේශනා වල තියෙන දේවල් සාමූහික ධර්ම හැටියට ගලපන්නේ. ඒවගේ අනිත් ඒවා - අභිධර්මයේ තිබෙන්නාවූ ශක්තීන් වෙනම. ඒක නිසා ඒ සමහර තැන් වලදී ගැලපෙන වෙලාවලුත් තිබෙනවා, සියුම් ස්වභාවය නිසා ගැලපෙන්නේ නැතුව යන තැනුත් තියෙනවා. ඒක නිසා ඒ මහත්තය ඒ කියපු එක හරි. ඒ විදියට හිතන එක පිළිබඳවත් මම අගේ කරනවා. ඒ විදියට තමයි. ඔය තියෙන්නේ, **ආයතනයක නාම ධර්ම ක්‍රියාත්මක වෙන තැනයි අක්‍රියාත්මකව ප්‍රවෘති කර්මජ රූප පවතින තැනයි** - ඔය පටලැවිල්ල ඕකේ තියෙන්නේ. ඒක නිසා වැඩිපුර මම මේ ගැන කියන්නේ නෑ. නමුත් ඒ හිතපු තාලේ හරි මහත්තයා. තෙරුවන් සරණයි!

හොඳයි ස්වාමීන් වහන්ස තෙරුවන් සරණයි!

හොඳයි දැන් කාල වෙලාවත් ගතවී ගියනිසා අපි ඉදිරි සතියටත් තියල අපි මේ වෙලාවේ අවසන් කරමුද?

එහෙමයි අපේ හාමුදුරුවනේ අපි එහෙනම් අද දවසේ වැඩසටහන නිමා කරමු. කල්‍යාණ මිත්‍රයනි අද දවසේත් අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ වටිනා කාලය වැය කරලා අපිට ඒ අතිඋතුම් වූ පට්ඨාන ධර්ම දේශනාවෙන් බොහෝ කාරණා ඉස්මතු කරලා පෙන්නුවා. ඒවගේම අපිට තිබෙන ගැටළු විසඳා ගැනීමට උන්වහසේ උපකාර උනා. ඉතින් අපි ලබන සතියේදී ස්වාමීන්වහන්සේ අපිට අද මාතෘකා වශයෙන් ලබාදුන් පුරේජාත ප්‍රත්‍යය යෙහි දෙයාකාරයකට බෙදී තිබෙන ආකාරය ගැන සාකච්ඡා කරමු. ඒවගේම අද දවසේදීත් ගෞරවණීය ස්වාමීන් වහන්සේ මතු කර දීපු කාරණාවල් නැවතත් ලබන සතියේ බදාදා ස්වාමීන්වහන්ස අපි ජයන්ත මහත්තයත් මුල් කරගෙන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. එහෙමනම් අද සම්බන්ධ වුනාවූ සියලුම කල්‍යාණ මිත්‍රයන් වෙනුවෙන් ඔබවහන්සේට ඔබවහන්සේ පතනා බෝධියකින් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමට අපට කලාවූ මේ උතුම් ධර්ම දානය මේ පුණ්‍ය ක්‍රියාව හේතුවක් වේවා! කියල ඉතාමත්ම බැති සිතින් යුතුව ප්‍රාර්ථනා කර සිටිනවා ස්වාමීන්වහන්ස, මම ඔබ වහන්සේට යොමු වෙන්නම් සාකච්ඡාව නිමා කිරීම සඳහා. තෙරුවන් සරණයි!

ස්වාමීන්වහන්සේ - හොඳයි පිංවත් හැමදෙනාටම යහපතක් සැනසිල්ලක් වේවා! ඉතින් අදත් අපි කරගෙන එන්නාවූ දහම් පාඩමේ කොටසක් ඉදිරිපත් කර ගත්තේ. ඒ නිසා අද යම් යම් කරුණු තේරෙන්න ඇති. අපි තව ටිකක් ඉස්සරහට භය නැතුව ධර්මය බුද්ධ ගරුත්වය ධර්ම ගරුත්වය ඇතුව සාකච්ඡා කරමු. එතකොට ගැටළු තැන් නිරාකරණය වෙනවා. ඉවසීමත් ඇතුව කරගෙන යනකොට ඔය පැටලවිලි ඔක්කොම නැති වෙලා යනවා. ඒ නිසා මේ වෙලාවේ ධර්මය ඇහීමෙන් මෙනෙහි කිරීමෙන් හිතෙන් උපදවා ගත්තාවූ සියලුම පුණ්‍ය ධර්මයන්ගේ බලයෙන් ශක්තියෙන් සහ තුනුරුවන් සතු අනන්ත අප්‍රමාණ ගුනානුභාව බලයෙන් සැමදෙනාටම සැනසිල්ලක් යහපතක් ශාන්තියක් වේවා! ඒවාගේම පිංවත්

දළුවත්ත මහත්මයාටත් නිදුක් නීරෝගී දීර්ඝායුෂ ශ්‍රීසම්පත් අභිවර්ධනය වේවා! ඉතින් මහත්මයාගේ කායික රෝග ඒවාගේම අපල උපද්‍රව සියල්ලම යටපත්වෙලා දුරුවෙලා නිරෝගී භාවය සලසාගෙන ලෝකයාට පිහිට වෙන්ට රත්නත්‍රයේ ආශීර්වාදය සැලසේවා! කියල අපි මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරන ගමන් ඒ පිංවත් මහත්මයාටත් පවුලේ සැම දෙනාටත් ඒවගේම මේ පිංවත් ජයන්ත මහතා ඇතුළු ඒ ප්‍රශ්න ඇසූ පිංවත් සැම දෙනාටමත් මේ උතුම් ධර්මය අවබෝධය පිණිස මේ කරාවූ සාකච්ඡාව - පින - ඒකාන්තයෙන්ම හේතුවේවා! සැමදෙනාම හොඳට ධර්ම මාර්ගයේ ගමන් කොට අවශ්‍ය කරන්නාවූ ඉන්ද්‍රිය ධර්මයන් සුවසේ මෝරවාගෙන බුද්ධාදී උත්තමයන් වහන්සේලා අවබෝධ කරගත්තාවූ සදාකාලික සැප ඇති අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා! ඒකාන්තයෙන්ම මේ ධර්ම සාකච්ඡාමය පින නිවන් පිණිස හේතු වසනා වේවා! කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබේන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.